# මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යාව පිළිබඳ උසස් අධ්‍යයනය සඳහා වූ ජාතික මධ්‍යස්ථානය

## දහනවවන වාර්ෂික වාර්තාව

# 2023

## දැක්ම

"මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා ක්ෂේත්‍රවල

දැනුම, සම්පත්, පර්යේෂණ, අධ්‍යාපනය සහ සමාජ ක්‍රියාකාරකම්

අතර සහ ක්‍රියා ගොඩනගමින්,

විශිෂ්ඨත්වයෙන් උසස් ජාතික සහ ජාත්‍යන්තර කීර්තිය ලත්

මධ්‍යස්ථානයක් බවට පත්වීම."

## මෙහෙවර

"සියලු ශ්‍රී ලාංකික විශ්ව විද්‍යාලවල ඉගැන්වීම් සහ පර්යේෂණ ශක්තිමත් කිරීමේ සහ වැඩිදියුණු කිරීමේ අවශ්‍යතාව හඳුනා ගනිමින්, පර්යේෂණ සහ ප්‍රතිපත්ති යෙදවුම් තුළින් විශ්වවිද්‍යාල රටේ සහ සමාජයේ සංවර්ධනයට විශ්වවිද්‍යාල දායක විය යුතු බව අවබෝධ කරගනිමින්, මානව ශාස්ත්‍ර සහ සමාජවිද්‍යා පිළිබඳ උසස් ජාතික මධ්‍යස්ථානය මගින් න්‍යායික සහ ව්‍යවහාරික පශ්චාත් උපාධි, පශ්චාත් ආචාර්ය උපාධි යන දෙකටම සහාය වනු ඇත. සහ මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පිළිබඳ වෙනත් පර්යේෂණ සහ එම දිශාවට විද්වතුන් පෙළඹවීම සහ ප්‍රතිලාභ ලබා දීමෙන් දියුණු චින්තනය සහ නිර්මාණාත්මක ප්‍රභවය ප්‍රවර්ධනය කරයි. මානව ශාස්ත්‍ර සහ සමාජවිද්‍යා පිළිබඳ උසස් ජාතික මධ්‍යස්ථානය මගින්ශ්‍රී ලංකාවේ විශ්ව විද්‍යාල පද්ධතිය තුළ ජාතික හා ජාත්‍යන්තර සංවිධාන සමඟ ජාලගත වෙමින් එහි අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ඉහළම ආයතනයක් වනු ඇත.’’

**පෙරවදන**



1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ 24 අ වගන්තියේ (1) උපවගන්තිය සමග සංයෝජිතව කියවියයුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආන්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 (2) ඡේදය මගින් පැවරී ඇති බලතල ප්‍රකාරව 2005 ඔක්තෝබර් අංක 2 දරන ආඥාපනත මගින් මානව හා සමාජවිද්‍යාත්මක පර්යේෂන සහ බුද්ධිමය සහයෝගීතා පුලුල් කිරීමේ අරමුනින් මානව හා සමාජවිද්‍යා උසස් අධ්‍යාපනය සඳහා වූ ජාතික මධ්‍යස්ථානය 2005 වර්ෂයේදී ස්ථාපිත කරන ලදී.ආයතනයේ (NCAS) මෙහෙවර ලෙස ක්ෂේත්‍රයේ සිටින විද්වතුන්, පර්යේෂකයන්, වෘත්තිකයන් සහ සිසුන් සඳහා අවශ්‍ය පුහුණුව සහ කුසලතා සංවර්ධනය ලබා ගැනීම සඳහා විවිධ අවස්ථා සලසා දීම සඳහා අපි කටයුතු කරමින් සිටිමු.

විවිධ හේතුකිහිපයක් නිසා 2023 වසර වැදගත් සංධිස්ථාන සලකුණු කිරීමට සමත් විය. කොවිඩ් 19 ව්‍යාප්තියෙන් පසු සේවා,රාජකාරි සහ කාර්යසාධනය පූර්ණකාලීන පදනමින් සැපයීමට සමත් වීමත් වසර 5 කට ආසන්න කාලයක් වැඩබලන අධ්‍යක්ෂවරයකුගේ අධීක්ෂණය යටතේ පැවති ආයතනයට පූර්ණකාලීන අධ්‍යක්ෂවරයකු බඳවා ගැනීමට හැකිවීමත් ඒ අතර වේ.

2021 – 2022 වර්ෂවලදී විවිධ ක්‍රියාකාරකම් පසුබෑමට ලක්වූ පසුබිමක සම්පූර්න සමාලෝචන ක්‍රියාවලියක් හරහා මානව හා සමාජවිද්‍යාත්මක ක්ශේත්‍රයේ අවශ්‍ය ශාස්ත්‍රඥයින් සඳහා අර්ධ මූල්‍යාධාර සැපයීමට පියවර ගැනීම තුලින් කාර්යසාධනය සාමාන්‍ය තත්වයට නැවත පත්කර ගැනීමට අප කටයුතු කරන ලදී. ඒ අනුව 2023 ජනවාරි හා ජූලි මාස වල වට දෙකකදී සිදුකරන ලද තෝරා ගැනීම් අනුව ප්‍රදාන 19 ක් ප්‍රදානය කිරීමට 2023 වර්ෂයේදී අපට හැකිවිය. ඊට අමතරව NCAS විසින් ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලවල මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා සහ ඒ ආශ්‍රිත අනෙකුත් විෂය ක්ෂෙත්‍ර පිළිබඳ ශාස්ත්‍රඥයින් සඳහා ඔවුන්ගේ පශ්චාද් උපාධි අධ්‍යයන කටයුතු පහසු කිරීම සඳහා පර්යේෂණ ක්‍රමවේද, සංඛ්‍යානමය විශ්ලේෂණය මෙන්ම අදාල කේෂෙත්‍ර අධ්‍යායන ක්‍රමවේද පිළිබඳ අඛණ්ඩ පුහුණුවක් ද ලබා දීමට කටයුතු කරමින් පවතී. 2023 වර්ෂයේදී ශාස්ත්‍රඥයින් ජාත්‍යන්තරව පිළිගත් සඟරා සහ උසස් ප්‍රමිතිගත ප්‍රකාශන වල පලකිරීම සඳහා පුහුනු කිරීමේ අරමුනින් “ග්‍රන්ථමිතික විශ්ලේෂණය සමඟ ක්‍රමානුකූල සාහිත්‍ය සමාලෝචනය ප්‍රගුණ කිරීම” මැයෙන් පාඨමාලාවක් හඳුන්වාදෙන ලදී. සහභාගිවන්නන්ගේ න්‍යායික හා ආනුභවික පර්යේෂණ කුසලතා ඉහළ නැංවීමේ අරමුණින් විශේෂඥ මණ්ඩලයක් මෙම විස්තීරණ පාඨමාලා පවත්වයි. දේශන ඉලෙක්ට්‍රොනික ඉගෙනුම් සම්පත් සහ මෘදුකාංග යෙදුම් සමඟ සංයෝජිතව සපයනු ලැබේ. පශ්චාද් උපාධි අපේක්ෂකයින්ට සංඛ්‍යානමය පුහුණුව සැපයීම සඳහා ස්ථාපිත පරිගනක විද්‍යාගාරයක් භාවිතා කරනු ලබයි. තවද NCAS විසින් පර්යේෂකයින් සඳහා වෙබ්අඩවිය මගින් විද්යුත් පුස්තකාල පහසුකම් සපයනු ලැබේ.

NCAS ආඥා පනතේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සම්බන්ධයෙන් 2023 වර්ෂයේදී කැපී පෙනෙන නවතම වැඩිදියුණු කිරීම් සිදුකිරීමට සමත් විය. NCAS ආඥාපනතේ 5 (II) වගන්තියට අනුව, NCAS විසින් පිරිනමනු ලබන අධ්‍යයන සහ වෘත්තීය වැඩසටහන් වල තත්වය සහතික කිරීමට ජ්‍යෙෂ්ඨ සාමාජිකයින්ගේ විද්‍යාලයක් පිහිටුවීමට අපට හැකි විය. කළමනාකරණ සභාවේ සහ රාජ්‍යාධිකාරී සභාවේ අනුමැතිය ඇතිව ඇතැම් නිර්ණායක සම්මත කිරීමට නිර්දේශ කරන NCAS හි තත්ත්ව සහතික කිරීමේ ආයතනය ලෙසද ඔවුන් ක්‍රියා කරයි. ආඥාපනතේ 5 (4) සහ 6 වගන්ති අනුව ජ්‍යෙෂ්ඨ සාමාජිකයින්ගේ විද්‍යාලයේ විෂය පථය සහ කලාපීය ප්‍රජාව සඳහා ඇති ඉල්ලුමට මුහුණ දීමේ දැඩි අවශ්‍යතාවය සැලකිල්ලට ගනිමින් කළමනාකරණ සභාවට නිර්දේශ කරන ලද NCAS විසින් පිරිනැමීමට යෝජිත ශාස්ත්‍රපති උපාධිය [SLQF Level 10], දර්ශනපති උපාධිය (MPhil Degree) [SLQF Level 11] සහ ආචාර්ය උපාධිය[SLQF Level 12] සඳහා අතුරු ව්‍යවස්ථා සකස් කිරීම කැපී පෙනෙන සන්ධිස්ථානයක් ලෙස දැක්විය හැකිය. සමාජ විද්‍යා සහ මානව ශාස්ත්‍ර යන පුලුල් විෂය ක්ෂේත්‍රයේ බහු-විනය සහ අන්තර් විෂය අධ්‍යයන සඳහා කේන්ද්‍රස්ථානය වශයෙන් NCAS සතුව එවැනි අධ්‍යයන සඳහා පහසුකම් සැලසීමේ හැකියාව ඇති අතර, සියළුම රාජ්‍ය විශ්ව විද්‍යාල මෙන්ම අනෙකුත් අදාළ පාලන

ආයතනවල සහයෝගීතාවයෙන් නුදුරු අනාගතයේ දී එහි ප්‍රථම ශාස්ත්‍රපති සහ ආචාර්ය උපාධි වැඩසටහන් දියත් කිරීමට ලැබීම සතුටට කරුණකි.

වසර දෙකකට පසුව නොවැම්බර් 29 වන දින සමාජ විද්‍යා සහ මානව ශාස්ත්‍ර (IRSSSH) 2023 5 වැනි ජාත්‍යන්තර පර්යේෂණ සම්මන්ත්‍රණය භෞතිකව පැවැත්වීමට හැකිවීම පිළිබඳව NCAS නිහතමානීව ආඩම්බර වේ. ලැබුණු දීර්ඝ සාරාංශ 132 න් 52 ක් පරිපූර්ණ සමාලෝචනයකින් පසුව තෝරාගෙන ඉදිරිපත් කරන ලද අතර ඒවා සම්මන්ත්‍රණ ක්‍රියාවලියේදි ප්‍රකාශයට පත් කරන ලදී. ප්‍රධාන කථිකයා ලෙස ආචාර්ය Lodewijk J. Wagenar සහභාගී වූ බව සතුටින් දන්වා සිටින අතර එහිදී මහාචාර්ය Maciej Kowalewski (පෝලන්තය), මහාචාර්ය Ankuran Dutta (ඉන්දියාව), මහාචාර්ය සඳගෝමි කොපරහේවා (Sandagomi Coperahewa) (ශ්‍රී ලංකාව), Md. Reyad Hossain (බංගලිදේශය), හිමාලි කුලරත්න මිය (ශ්‍රී ලංකාව) කමිටු සාමාජිකයන් ලෙස සහභාගී වූ අතර විෂය පිළිබඳ ඔවුන්ගේ දැනුම හා අත්දැකීම් බෙදාහදා ගන්නා ලදී.

NCAS සංයුක්ත සැලැස්මේ දක්වා ඇති පරිදි මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යාවන්හි උසස් අධ්‍යයනවල විශිෂ්ටත්වයේ මධ්‍යස්ථානයක් ලෙස NCAS හි තත්ත්වය උසස් කිරීම සහ එහි සේවාවන් සාම්ප්‍රදායික ඉගැන්වීම්-ඉගෙනුම් සංසදයෙන් ඔබ්බට ජීවිත කාලය පුරාම ඉගෙනීමේ අවස්ථා සඳහා පුළුල් කිරීම සහ වඩා හොඳ පර්යේෂණ සහ යෙදුම සඳහා ප්‍රබල ප්‍රවේශයන් ඇති කිරීම NCAS හි ප්‍රධාන අභිප්‍රාය වේ.

**මහාචාර්ය ප්‍රශාන්ති නාරංගොඩ**
**අධ්‍යක්ෂ**

## **NCAS හි ආයතනික ඉලක්ක, අරමුණු සහ උපාය මාර්ග**

| |
|---|
| ඉලක්කය **1:** ආචාර්ය උපාධි සඳහා වන පශ්චාද් උපාධි පුහුණුව සඳහා පහසුකම් සැලසීම |
| අරමුණ : **1.** රාජ්‍ය විශ්ව විද්‍යාලවල පශ්චාද් උපාධි සුදුසුකම් ලත් විද්වතුන්ගේ ප්‍රමාණය වැඩිකිරීම |
| උපාය මාර්ගය 1.1.1: කීර්තිමත් ජාත්‍යන්තර සහ දේශීය විශ්වවිද්‍යාලවල ආචාර්ය උපාධි හැදෑරීම සඳහා අධ්‍යයන කාර්ය මණ්ඩලයෙහි ස්ථිර ආචාර්යවරුන් හට මූල්‍යාධාර සැපයීම |
| උපාය මාර්ගය 1.1.2: ආචාර්ය උපාධි අපේක්ෂකයින් සඳහා අවබෝධතා ගිවිසුම් යටතේ කොන්දේසි වලට යටත්ව මූල්‍ය සහාය සැපයීම |
| උපාය මාර්ගය 1.1.3: පර්යේෂණ පිළිබඳ පුහුණුව සඳහා විශ්වවිද්‍යාල ආචාර්යවරුන් දිරිමත් කිරීම |
| ඉලක්කය 2: මානව සම්පත් උත්පාදනය සඳහා හුවමාරු වැඩසටහන් මගින් සායකවීම. |
| අරමුණ 2. 1 පශ්චාද් අධ්‍යාපනය දිරිගැන්වීම සඳහා ස්ථාපිත ශිෂ්‍යත්ව වැඩසටහන්/ හුවමාරු වැඩසටහන් හඳුන්වාදීම. |
| ඉලක්කය **3:** ජාතික මට්ටමින් පර්යේෂණ හැකියාවන් ප්‍රවර්ධනය කිරීම |
| අරමුණ : **3.1** පර්යේෂණ සහභාගීත්වය වැඩි දියුණු කිරීම සහ විද්වත් කටයුතු බෙදා හැරීම |
| උපාය මාර්ගය 3.1.1: නව පර්යේෂණ සොයාගැනීම් බෙදා හැරීමට/බෙදා ගැනීමට සම්මන්ත්‍රණ මාර්ගයෙන් පර්යේෂණ සංස්කෘතිය ප්‍රවර්ධනය කිරීම |
| උපාය මාර්ගය 3.1.2: කෙටිකාලීන පර්යේෂණ කටයුතු සඳහා විද්වතුන් දිරිමත් කිරීම |
| අරමුණ **:** 3.2 ප්‍රකාශන මගින් පර්යේෂණ සම්බන්ධ සොයාගැනීම් සහ විද්වත් කටයුතු ව්‍යාප්ත කිරීම |
| උපාය මාර්ගය 3.2.1: **නව පර්යේෂණ සොයාගැනීම් බෙදා හැරීමට/බෙදා ගැනීමට සම්මන්ත්‍රණ මාර්ගයෙන් පර්යේෂණ සංස්කෘතිය ප්‍රවර්ධනය කරන්න** |
| උපාය මාර්ගය 3.2.2: **කෙටිකාලීන පර්යේෂණ කටයුතු සඳහා විද්වතුන් දිරිමත් කිරීම** |
| ඉලක්කය **4:** නැගී එන ශාස්ත්‍රීය සහ වෘත්තීය ප්‍රජාවන්ගේ උනන්දුව සහ හැකියාව සඳහා සත්කාර කිරීම |
| අරමුණ **:** 4.1 වෘත්තීය/ වෘත්තීය කුසලතා වර්ධනය කිරීම සඳහා විශ්වවිද්‍යාල පද්ධතිය තුළ සහ ඉන් පිටත අධ්‍යයන ප්‍රජාවට සත්කාර කිරීම |
| උපාය මාර්ගය 4.1.1: අධ්‍යයන ප්‍රජා ක්‍රම සහ දත්ත විශ්ලේෂණය සහ පරීක්ෂණ පිළිබඳ පර්යේෂණ පුහුණුව සඳහා විශ්වවිද්‍යාල ගුරුවරුන් දිරිමත් කිරීම |
| **ඉලක්කය 05: පර්යේෂණ සංස්කෘතිය සඳහා නව දායකත්වයන් පිළිබිඹු කරමින් දිරිමත් කිරීම සහ පෝෂණය කිරීම** |
| අරමුණ **5.1:** වත්මන් සමාජ-ආර්ථික පර්යේෂණ ගැටළු පිළිබඳව විශ්වවිද්‍යාල විද්වතුන් සහ උනන්දුවක් දක්වන විද්වතුන් දැනුවත් කිරීම සහ සම්බන්ධ කර ගැනීම පර්යේෂණ සොයාගැනීම් බෙදා හැරීම |
| උපාය මාර්ගය 5.1.1: තනි පුද්ගල සහ සහයෝගී ව්‍යාපෘතියක් සංවිධානය කිරීම |
| උපාය මාර්ගය 5.1.2: ක්ෂේත්‍රවල සහ සම්ප්‍රදායික දැනුම් කේන්ද්‍රස්ථානයේ ප්‍රවීණයන් ආදීන් සමඟ |

| |
|---|
| විද්වත් සාකච්ඡා. |
| **අරමුණ 5.2: ශ්‍රවණ ඉතිහාසය සහ සමාජ-සංස්කෘතික අන්තර්ක්‍රියා හරහා ආනුභවික සාක්ෂි සෙවීම දිරිමත් කිරීම** |
| උපාය මාර්ගය 5.2.1. "මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යාව" සම්බන්ධ සත්‍ය/සාම්ප්‍රදායික දැනුම ආරක්ෂා කිරීම |
| **ඉලක්කය 06: විශ්වවිද්‍යාල පද්ධතියේ සහ අනෙකුත් වෘත්තීය ආයතනවල පරිපාලන කාර්ය මණ්ඩලයේ හැකියාවන් වැඩි දියුණු කිරීම** |
| **අරමුණ 6.1: විශ්වවිද්‍යාල පද්ධතියේ පරිපාලන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලය සවිබල ගැන්වීම** |
| උපාය මාර්ගය 6.1.1: වෘත්තීය සහ පරිපාලන කුසලතා පිළිබඳ පුහුණුව / යාවත්කාලීන දැනුම ලබා දීම |
| **ඉලක්කය 07: අධ්‍යයන සහාය/අනධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා පුහුණු/ ප්‍රවීණතා/කාර්යක්ෂමතා වැඩසටහන් පැවැත්වීම** |
| **අරමුණ 7.1: විශ්වවිද්‍යාල පද්ධතියේ අධ්‍යයන සහාය සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලය සවිබල ගැන්වීම** |
| උපාය මාර්ගය 7.1.1: පුහුණුව සැපයීම |
| **ඉලක්කය 08- NCAS ගොඩනැගිලි පරිශ්‍රයේ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම** |
| **අරමුණ 8.1: මධ්‍යස්ථානය විසින් පවත්වනු ලබන නැවත සෙවීම්, පරිපාලනමය සහ ඉගෙනුම් කටයුතු සඳහා පහසුකම් සැලසීම සහ ශක්‍ය පරිසරයක් සැපයීම** |
| උපාය මාර්ගය 8.1.1: NCAS හි දැනට පවතින ගොඩනැගිලි පරිශ්‍රයේ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම |
| උපාය මාර්ගය 8.1.2: වඩා යහපත් ඉගැන්වීම්-ඉගෙනුම් පරිසරයක් සැපයීම |

පටුන


| | |
|---|---|
| දැක්ම සහ මෙහෙවර | i |
| පෙරවදන | ii-iii |
| NCAS හි ආයතනික ඉලක්ක, අරමුණු හා උපාය මාර්ග | 01-02 |
| පටුන | 03 |
| වගු සහ ප්‍රස්තාර | 04 |
| ආයතනික තොරතුරු | 05 |
| හැඳින්වීම | 06-07 |
| NCAS හි කාර්ය මණ්ඩලය | 08-10 |
| NCAS හි පාලනාධිකාරිය සහ කළමනාකරණය | 11-16 |
| වැඩමුළු/පාඨමාලා/ඉදිරිපත් කිරීම් | 17-19 |
| NCAS හි තොරතුරු තාක්ෂණ සම්පත් | 20 |
| NCAS හි ශිෂ්‍යත්ව වැඩසටහන | 21-32 |
| පුස්තකාලය / විද්‍යුත් සම්පත් | 33 |
| NCAS ගොඩනැගිලි පරිශ්‍ර ප්‍රතිසංස්කරණය | 33 |
| විගණන සහ කළමනාකරණ කමිටු වාර්තාව – 2023 | 34-35 |
| මූල්‍ය ප්‍රකාශන | 36-59 |
| විගණකාධිපති වාර්තාව | 60-65 |
| විගණන විමසුමට පිළිතුරු | 66 |

වගු සහ ප්‍රස්ථාර

වගු


වගුව **01:** එන්.සි.ඒ.එස්. හි සේවක තනතුරු 09

වගුව **02:** රාජ්‍යාධිකාරී සභාවේ සංයුතිය 10-11

වගුව **03:** කළමනාකරණ සභාවේ සංයුතිය 11-12

වගුව **04:** සංශෝධිත ජීවන දීමනාව 14-15

වගුව **05: 2023** දී පවත්වන ලදවැඩමුළු/කෙටිකාලීන පාඨමාලා/ඉදිරිපත් කිරීම් වල සාරාංශය 15

වගුව **06: NCAS** ප්‍රදාන බෙදීම **- 2023** 19

වගුව 07: **2005/2023** විෂය ප්‍රවර්ගය අනුව ප්‍රදාන ලාභීන්ගේ බෙදීම 20

වගුව **08:** ආචාර්යඋපාධි ශිෂ්‍යත්ව සඳහා භාණ්ඩාගාර අරමුදල්භාවිතා කිරීම 22

වගුව **09:** ශ්‍රීලංකාවිශ්වවිද්‍යාලවිසින්සේවයේයොදවාඇතිඑන්.සි.ඒ.එස්.හිආචාර්යඋපාධි ශිෂ්‍යයන් බෙදා හැරීම 24

වගුව **10**: සම්පූර්ණ කර ඇති ප්‍රදාන 26-27

වගුව **11**: **2023** වර්ෂය තුළ ප්‍රදානය කරන ලද නව ප්‍රදාන 28-31

වගුව **12**: **QUT** (ඕස්ට්‍රේලියාව) **-** එන්.සි.ඒ.එස්. ආචාර්ය උපාධි ශිෂ්‍යත්ව වැඩසටහන 32


ප්‍රස්ථාර


01. NCAS ආයතනික ව්‍යුහය 07

02. **2005-2023** විෂය ප්‍රවර්ගය අනුව ප්‍රදානලාභීන්ගේ බෙදීම 21

03. ලබා දෙන ලද අරමුදල් **(2005- 2023)** 23

04. ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලවල සේවයේ නියුතු ආචාර්ය භවතුන් වෙත වසර **2005-2023** දක්වා ලබා දී ඇති ලබා දී ඇතිඑන්.සි.ඒ.එස්.මූල්‍යප්‍රතිපාදනබෙදීයාම 25

## ආයතනික තොරතුරු

ආයතනයේ නම : මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා පිළිබඳ උසස් අධ්‍යයන සඳහා ජාතික මධ්‍යස්ථානය (එන්.සී.ඒ.එස්.)

ලියාපදිංචි කාර්යාලය : 6A, සුබස්තාන් උද්‍යානය, වෝඩ් පෙදෙස, කොළඹ 07

තත්ත්වය සහ නීතිමය ආකෘතිය : 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 24 අ වගන්තිය යටතේ 2005 අංක 02 දරණ ආඥාපනත මගින්
ස්ථාපිත රාජ්‍ය ව්‍යවස්ථාපිත මණ්ඩලය

අරමුදල් මූලාශ්‍රය : භාණ්ඩාගාර අරමුදල්

මූල්‍ය කාලසීමාව : 2023 ජනවාරි 01 සිට 2023 දෙසැම්බර් 31 දක්වා

අධ්‍යක්ෂක : ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ප්‍රේමකුමාර ද සිල්වා ( 2023 ජනවාරි 30 දක්වා )
මහාචාර්ය ප්‍රශාන්ති නාරංගොඩ මිය ( 2023 පෙබරවාරි 01 සිට)

විගණක : ජාතික විගණන කාර්යාලය - ශ්‍රී ලංකාව
අභ්‍යන්තර විගණකවරුන්, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසම

බැංකුකරුවන් : ලංකා බැංකුව, ටොරින්ටන් ශාඛාව

සම්බන්ධතා විස්තර : දුරකථන : 011-2685850, 0112693974
ෆැක්ස් : 0112693975
විද්‍යුත් තැපැල : info@ncas.ac.lk
වෙබ්: www.ncas.ac.lk

## හැදින්වීම

මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යාව පිළිබඳ උසස් අධ්‍යයන සඳහා ජාතික මධ්‍යස්ථානය (NCAS) 1978 අංක 16 විශ්වවිද්‍යාල පනතේ 24A වගන්තිය යටතේ 2005 ඔක්තෝබර් 19 වැනි දින නිකුත් කරන ලද අංක 1415/17 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත් කරන 2005 අංක 02 දරන ආඥාපනත මගින් නීත්‍යානුකූලව ස්ථාපිත කරන ලද සහ 2008 සැප්තැම්බර් 15 වැනි දින දරන අංක 1567 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කරන ලද 2008 අංක 3 දරන එන්.සි.ඒ.එස්. (සංශෝධන) ආඥා පනත මගින් සංශෝධිත ප්‍රඥප්තිය යටතේ පිහිටුවන ලද උසස් අධ්‍යාපන ආයතනයකි.

රාජ්‍ය විශ්ව විද්‍යාල පද්ධතියේ සමාජවිද්‍යා සහ මානවශාස්ත්‍ර යන ක්ෂෙත්‍රවල සේවය කරන අධ්‍යයන ප්‍රජාවගේ නැගී එන අවශ්‍යතා සපුරාලීම සඳහා එන්.සි.ඒ.එස්. මූලික වශයෙන් පිහිටුවන ලදී. මහාචාර්ය සේනක බණ්ඩාරනායක සහ අදාළ ක්ෂෙත්‍රවල ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරුන් කිහිප දෙනෙකු විසින් ශීඝ්‍රයෙන් ව්‍යාප්ත වන ජාතික විශ්වවිද්‍යාල පද්ධතියේ සමාජවිද්‍යා හා මානවශාස්ත්‍ර අංශයේ අධ්‍යයන අවශ්‍යතා සපුරාලීම සඳහා පවත්නා විශ්වවිද්‍යාල පද්ධතියෙන් බැහැර ස්වාධීන ආයතනයක් පිහිටුවීමේ අවශ්‍යතාව ඉටුකරලනු වස් එය ආරම්භ කරන ලදී.විද්‍යා, ඉංජිනේරු,වෛද්‍ය විද්‍යා ආදී ප්‍රධාන අධ්‍යන ක්ශේත්‍ර සඳහා රාජ්‍ය/ ජාත්‍යන්තර පිළිගැනීමක් සහිත පර්යේෂණ අවස්ථා සහ පශ්චාද් උපාධි දිරිගන්වන ක්‍රම පිරිනැමෙන පසුබිමක සමාජවිද්‍යා සහ මානවශාස්ත්‍ර ක්ශේත්‍රයේ අවශ්‍යතා බටුකරනු ලබන ඒකම රාජ්‍ය ආයතනය NCAS වේ. 1970 දශකයේ අග භාගයේදී සුදුසුකම් ලබා විශ්ව විද්‍යාලවලට ප්‍රවේශ වීමට අපේක්ෂා කරන සිසුන් සංඛ්‍යාව වැඩිවීමට ප්‍රතිචාර වශයෙන් ප්‍රතිපත්ති වෙනස් කිරීමත් සමඟ දිවයිනේ ප්‍රදේශ කිහිපයක නව විශ්ව විද්‍යාල ගණනාවක් විවෘත විය. මෙම නව ආයතනවල පුරප්පාඩු පිරවීමට අවශ්‍ය කාර්ය මණ්ඩල අවශ්‍යතා ස්ථාපිත විශ්වවිද්‍යාලවලින් ලබා ගන්නා ලදී. එම ව්‍යායාමයේ අවසාන ප්‍රතිඵලය වී ඇත්තේ ශාස්ත්‍රීය ප්‍රජාව විනාශ කිරීම සහ ස්ථාපිත විශ්වවිද්‍යාලවල පවා ඉගැන්වීම දුර්වල වීමයි.

අලුතින් පිහිටුවන ලද විශ්වවිද්‍යාල වල පර්යේෂණ සහ උසස් අධ්‍යාපන පහසුකම් සැලසීම සඳහා අත්දැකීම් සහ සුදුසුකම් ලත් කන්ඩායම් හිඟ බව මෑතකාලීන සංඛ්‍යාත්මක දත්ත මගින් පෙන්වා දී ඇත. නව විශ්වවිද්‍යාල පිහිටුවීමත් සමඟ ඇති වූ රික්තය පිරවීම සඳහා කළ හැකි ප්‍රතිකර්මයක් ලෙස මානවශාස්ත්‍ර හා සමාජ විද්‍යා ක්ෂේත්‍රවල නවක බඳවා ගැනීම් සඳහා පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු සඳහා උනන්දු කරවීම තුළින් ඔවුන් පුහුණු කිරීම සිදු කර ඇත. පර්යේෂණ ක්‍රමවේද, පර්යේෂන යෝජනා සංවර්ධනය, සමාජ විද්‍යා පර්යේෂණ සඳහා අවශ්‍ය සංඛ්‍යාන ක්‍රම සහ ශාස්ත්‍රීය ලේඛන සඳහා අවශ්‍ය ලේඛන කුසලතා වර්ධනය කිරීම සහ මූල්‍ය සහයෝගය සැපයීම මගින් තරුණ ගුරුවරුන් පශ්චාත් උපාධි අධ්‍යයනය සඳහා සූදානම් කිරීමට එන්.සි.ඒ.එස්. මූලික විය. දේශීය හා විදේශීය අධ්‍යයන කටයුතු සඳහා රජය මගින් ලබාදෙන ලද මූල්‍යමය ප්‍රදාන වර්ෂ 2023 වන විට 527 ක් දක්වා වර්ධනය වීම සඳහන් කලයුතු වැදගත් කරුණකි. මේ වන විට එන්.සි.ඒ.එස්. ආයතනය විවිධ ඉදිරි දර්ශන ඔස්සේ මූල්‍ය සහයෝගය ලබාදීම තුලින් විශ්වවිද්‍යාල අංශයේ විශාලතම මානව සම්පත් සංවර්ධන පදනම බවට පත්ව ඇත.

අධ්‍යක්ෂ ලෙස මහාචාර්ය මර්වින් ලාල් ධර්මසිරි මහතාගේ ධූර කාලයෙන් පසු අධ්‍යක්ෂ තනතුර 2023 වර්ෂය දක්වා පුරපුපාඩු වූ අතර ඉන්පසු විශ්වවිද්‍යාල කොමිෂන් සභාවේ උපසභාපතිවරයා විසින් වැඩබැලීමේ පදනමින් දරන ලදී. 2023 පෙබරවාරි 01 දින සිට බලපැවැත්වන පරිදි විශ්වවිද්‍යාල කොමිෂන් සභාව විසින් කැළණිය විශ්වවිද්‍යාලයේ මහාචාර්ය ප්‍රශාන්ති නාරංගොඩ මිය අධ්‍යක්ෂ තනතුරට පත්කරන ලද අතර ඒතුමිය විසින් පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු සඳහා වන මූල්‍ය ප්‍රදාන සඳහා වූ NCAS මාර්ගෝපදේශ සංශෝධනය කිරීමට පියවර ගන්නා ලද අතර ප්‍රධාන වශයෙන් මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා ක්ෂේත්‍රවල අධ්‍යයන කාර්යමණ්ඩලයේ ප්‍රයෝජනය උදෙසා ඔවුන්ගේ පර්යේෂණ හැකියාවන් වැඩිදියුණු කිරීම සඳහා පුහුණු වැඩසටහන් කිහිපයක් හඳුන්වා දෙන ලදී. Nvivo/AMOS/Eviews වැනි නවීන මෘදුකාංග භාවිතයෙන් සමාජ විද්‍යා පර්යේෂණවල ගුණාත්මක පර්යේෂණ අංශ සංවර්ධනය කිරීම මෙම පුහුණු වැඩසටහන් හඳුන්වාදීමේ ප්‍රධාන අරමුණ විය. සිදුවීම් පිළිබඳ විස්තර වෙන වෙනම ලැයිස්තුගත කර ඇත. උසස් අධ්‍යාපන අංශයේ පර්යේෂණ සහ උසස් අධ්‍යයන ප්‍රවර්ධනය හා සංවර්ධනය සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂය තුළ NCAS විසින් සිදු කරන ලද

ක්‍රියාකාරකම්වල ප්‍රතිඵල මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යාවට පමණක් සීමා නොවී අනෙකුත් ආශ්‍රිත ක්ෂේත්‍රයන්හි ද බලපෑම් ඇති කරන බව සඳහන් කළ යුතුය.

තවද, ජ්‍යෙෂ්ඨ සාමාජිකයින්ගේ විද්‍යාලයක්, කළමනාකරණ සභාවට වාර්තා කරන තත්ත්ව සහතික කිරීමේ ඒකකයක් පිහිටුවීමට ඒතුම්ය මූලික පියවර ගත් අතර, NCAS ආඥාපනතට අනුව NCAS විසින් පිරිනැමීමට යෝජිත ශාස්ත්‍රපති (Masters), උපාධි (Degrees), දර්ශනපති MPhil සහ ආචාර්ය උපාධි (PhD Degress සඳහා විභාග අතුරු නීති සකස් කරන ලදී. බලධාරීන් විසින් සැමවිටම නොසලකා හරින ලද හෝ අවධානය යොමු නොකල සමාජ විද්‍යා හා මානව ශාස්ත්‍ර ක්ෂේත්‍රයේ සාමාන්‍ය පර්යේෂණ සංස්කෘතිය, පර්යේෂණ ක්‍රම සහ ක්‍රමවේදයන් හඳුන්වාදීම සහ ආරම්භ කිරීම සඳහා මෙය NCAS විසින් ලබාගත් සුවිශේෂී ජයග්‍රහණයක් වනු ඇත.

2023 වර්ෂය මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා පිළිබඳ උසස් අධ්‍යයන සඳහා ජාතික මධ්‍යස්ථානය NCAS හි බොහෝ ක්‍රියාකාරකම් සඳහා වෙන් කර ඇත.ප්‍රධාන හැරවුම වන්නේ COVID-19 ව්‍යාප්තියෙන් අඩාල වූ එහි පූර්ණ කාලීන භෞතික ක්‍රියාකාරිත්වයයි. ඒ සමඟින් NCAS විසින් භෞතික මාදිලියෙන් සහ ඇතැම් අවස්ථාවල දෙමුහුන් මාදිලියෙන් පුහුණු වැඩසටහන් බොහොමයක් පවත්වන ලද අතර, හුදකලාවේ හිඩැස පිරවීම සඳහා ඔවුන්ගේ දැනුම රැස් කර බෙදා ගැනීමේ අරමුණින් සියලුම පර්යේෂකයින් හට ඉඩ සලසමින් NCAS විසින් සමාජ විද්‍යා සහ මානව ශාස්ත්‍ර පිළිබඳ 5 වන ජාත්‍යන්තර පර්යේෂණ සම්මන්ත්‍රණය (IRSSSH) 2023, සම්පූර්ණයෙන්ම භෞතික මාදිලිය මත පැවැත්වීම සඳහා කටයුතු සිදු කරන ලදී. 2023 නොවැම්බර් 29 වැනි දින "උරුමය සහ සංස්කෘතිය: දිවංගත මහාචාර්ය සේනක ඩයස් බණ්ඩාරනායක නැවත බැලීම" යන පුළුල් තේමාව යටතේ තෝරාගත් ඉදිරිපත් කරන්නන් 52 දෙනෙකුගේ සහභාගීත්වයෙන් එය සාර්ථකව පැවැත්විණි, එහි ප්‍රධාන දේශනය ඇම්ස්ටර් ඩෑම් කෞතුකාගාරය හි හිටපු භාරකරු සහ ශ්‍රී ලංකාවේ ලන්දේසි ඉතිහාසය හැදෑරූ ආචාර්ය ලොඩෙවික් ජේ. වාගේනාර් (Dr. Lodewijk J. Wagenaar) විසින් පවත්වන ලද අතර, මහාචාර්ය මාසීජ් කොවලෙව්ස්කි (පෝලන්තය)( Professor Maciej Kowalewski (Poland)), මහාචාර්ය අංකුරන් දත්තා (ඉන්දියාව) (Professor Ankuran Dutta (India), මහාචාර්ය සඳගෝමි කොපරහේවා (ශ්‍රී ලංකාව) ( Sandagomi Coperahewa (Sri Lanka)), Md. රියාද් හුසේන් ( බංගලිදේශය) (Md. Reyad Hossain (Bangladesh)), මහාචාර්ය මිරා අබ්දුල් සාදික් (ඉන්දියාව) Professor Mir Abdul Sofique (India), සහ හිමාලි කුලරත්න මිය(ශ්‍රී ලංකාව) (Ms. Himalee Kularathne (Sri Lanka))විසින් විෂය පිළිබඳ ඔවුන්ගේ දැනුම හා පළපුරුද්ද සමඟ කම්ටු සාකච්ඡාවට දායක විය.

**ප්‍රස්ථාර 01: එන්.සි.ඒ.එස්. ආයතනික ව්‍යුහය**



## 2023 වර්ෂයේ මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා පිළිබඳ උසස් අධ්‍යයන සඳහා ජාතික මධ්‍යස්ථානය (NCAS) කාර්ය මණ්ඩලය

අධ්‍යක්ෂ

- **ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ප්‍රේමකුමාර ද සිල්වා-** වැඩ බලන අධ්‍යක්ෂ ( *31.01.2023 දක්වා*)
  BA, MA (Colombo), MSc & PhD (Edinburgh, UK)

- **මහාචාර්ය ප්‍රශාන්ති නාරංගොඩ මිය ( 01.02.2023 සිට)**
  BA (Hons) (Kelaniya), MSc **(**PGIA, Kelaniya), PhD (West California, USA)

**ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති**

- ආචාර්ය සම්පත් චන්ද්‍රසේන,

PhD in Information Technology (CCS University),
Master of Library and Information Science (University of Kelaniya).
MSc. in Information Security (CMB), B.Tech.(Computer Science and Engineering)
BIT in Information Technology (UCSC)
Diploma in Management (OUSL), Higher Diploma in Information Technology (CMB)
Member of British Computer Society (MBCS) and Computer Society of Sri Lanka (MCSSL).

**ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී**

- ටී. එලන්වෙලියපල්ලවන් මහත්මිය

B.Sc. Agriculture (Hons.) (EUSL), Master of Science in Food Science and Technology (PDN)

**ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී**

- ජී. ආර්.කේ.එස් ගනේගොඩ මහතා

ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය - II පන්තිය
BSc Accounting (Special) - Sri Jayawardanepura
Master of Business Management - IHRA

**අනෙකුත් කාර්ය මණ්ඩලය**

- ඒ.එල්.ඩී. පෙරේරා මහතා - පුස්තකාල තොරතුරු සහකාර (ශ්‍රේණිය - II)
- කේ.එම්.ජී.ජී. ධනුෂ්ක මහතා - කළමනාකරණ සහකාර (පොත් තැබීම) (ශ්‍රේණිය - I)
- ආර්.කේ.පී.අයි. රත්නායක මහතා - කළමනාකරණ සහකාර (ශ්‍රේණිය – III)
- එම්.පි.පි.කේ. ජයරත්න මෙනවිය - කළමනාකරණ සහකාර (ශ්‍රේණිය – III)
- ඒ. එම් ඒ. එස්. එම් අබේවික්‍රම - කළමනාකරණ සහකාර (ශ්‍රේණිය – III)
- විනෝදිත හෙට්ටිආරච්චි මහතා - කළමනාකරණ සහකාර (ශ්‍රේණිය – III)
- .පී.කේ. බාලසූරිය මහතා - වැඩ සහායක (Gr. III)
- එච්.එස්.බී. කරුණාරත්න මහතා - වැඩ සහායක (Gr. III)

වගුව **01:** මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා පිළිබඳ උසස් අධ්‍යයන සඳහා ජාතික මධ්‍යස්ථානය හි සේවක තනතුරු

| අනු අංකය | තනතුර | | වැටුප් කේතය | | අනුමත සේවක සංඛ්‍යාව | **2023.12.31** දිනට පවතින සේවක සංඛ්‍යාව | පුරප්පාඩු |
|---|---|---|---|---|---|---|---|
| **ජ්‍යෙෂ්ඨ මට්ටම** | | | | | | | |
| 1 | අධ්‍යක්ෂ | | U - AC 5(II) | | 1 | 1 | - |
| 2 | ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිකාරී | | U - AC 3(II) | | 1 | 1 | - |
| 3 | ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී | | U- EX 2(II) | | 1 | 1 | - |
| 4 | ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී | | U- EX 2(II) | | 1 | 1 (වැඩබලන) | 1 |
| **තෘතීයික මට්ටම** | | | | | | | |
| 5 | සහකාර ජාල කළමනාකරු | | U- AS 2(II) | | 1 | - | 1 |
| **ද්විතීයික මට්ටම** | | | | | | | |
| 6 | කළමනාකරණ සහකාර | | U-MN 1(III) | | 4 | 2 | 2 |
| 7 | කළමනාකරණ සහකාර (පොත් තැබීම) | | U-MN 1(I) | | 1 | 1 | - |
| 8 | පුස්තකාල තොරතුරු සහකාර | | U-MN 1(II) | | 1 | - | 1 |
| **ප්‍රාථමික මට්ටම** | | | | | | | |
| 9 | රියදුරු | | U-PL 3(III) | | 1 | - | 1 |
| 10 | වැඩ සහායක | | U-PL 1(III) | | 2 | 2 | - |

## 2. ආයතනයේ (NCAS) පාලනාධිකාරිය සහ කළමණාකරනය

2008 සැප්තැම්බර් 15 දිනැති අංක 1567 අතිවිශේෂ ගැසට් පත්‍රයෙහි පළකරන ලද 2008 අංක 3 දරන NCAS (සංශෝධිත) ආඥාපනතේ විධිවිධාන ප්‍රකාරව ප්‍රධාන ආයතන දෙකක් වේ.

අ. රාජ්‍යාධිකාරී සභාව

ආ. කළමනාකරණ සභාව

### 2.1 <u>රාජ්‍යාධිකාරී සභාවේ ව්‍යවස්ථාපිත රැස්වීම්</u>

ප්‍රධාන ප්‍රතිපත්ති සම්පාදන ආයතනය සහ මධ්‍යස්ථානයේ පාලන අධිකාරිය වන රාජ්‍යාධිකාරී සභාව අවම වශයෙන් වසරකට දෙවරක් රැස්වේ.

රැස්වීම සඳහා ගණපූරණය මුළු සාමාජිකත්වයෙන් හතරෙන් එකකි

<table>
<tr><th colspan="3">රාජ්‍යාධිකාරී සභාවේ සාමාජික සංයුතිය</th></tr>
<tr><td>ගරු ආචාර්ය සුසිල් ප්‍රේමජයන්ත</td><td colspan="2">උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ අමාත්‍ය</td></tr>
<tr><td>ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සම්පත් අමරතුංග<br>B.A. Econ. (Special)(SJP); M.A. Econ. (Colombo); MSc. Econ. of Rural Dev. (Saga, Japan); Ph.D. (Kagoshima, Japan)</td><td colspan="2">විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපති</td></tr>
<tr><td>ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ප්‍රේමකුමාර ද සිල්වා (31.01.2023 දක්වා)<br>BA, MA (Colombo), MSc & PhD (Edinburgh, UK)<br>මහාචාර්ය ප්‍රශාන්ති නාරංගොඩ මිය ( 01.02.2023 සිට )<br>BA(Hons) (Kel.), MSc (PGIAR, Kel.), PhD (California, USA)</td><td colspan="2">කළමනාකරණ සභාවේ සභාපති NCAS</td></tr>
<tr><td>ජ්‍යෙෂ්ඨ මහාචාර්ය එල් මානවඩ්ඩු<br>BA (Colombo), M.Sc (A.I.T, Thailand), Ph.D (Colombo)</td><td>පීඨාධිපති ,ශාස්ත්‍ර පීඨය කොළඹ විශ්වවිද්‍යාලය</td><td rowspan="5">විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ස්ථාවර කමිටු විසින් නම් කරන ලද මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා විෂයයන්ට අදාළ පීඨාධිපතිවරුන් හය දෙනෙකු අදාළ වේ</td></tr>
<tr><td>මහාචාර්ය කේ සුතාකර් ( 2023 ජනවාරි දක්වා)<br>B.A.(Hons) (Jaffna), M.A. (Colombo), PGD.(India), M.Tech. (India), Ph.D (Singapore).<br>මහාචාර්ය ඒස් රගුරාම් ( 2023 ජනවාරි සිට)<br>B.Sc. (University of Madras, India), Master of Journalism and Mass Communication (Madurai Kamaraj University, India), PhD (Gandhigram Rural University, India)</td><td>පීඨාධිපති ,ශාස්ත්‍ර පීඨය යාපනය විශ්වවිද්‍යාලය</td></tr>
<tr><td>මහාචාර්ය එන් එස් පුංචිහේවා<br>LLB (Colombo), LLM (MIPLC, Germany), PhD (University of Munich, Germany)</td><td>පීඨාධිපති, නීති පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය</td></tr>
<tr><td>ආචාර්ය ඊ.එම්.පී.සී.එස්. ඒකනායක<br>B.A. Hons. (Peradeniya), PGDE (Peradeniya), M.Ed. (Sussex, UK), M.Phil. (Colombo), and Doctor of Education (Leicester, UK).</td><td>පීඨාධිපති, ශාස්ත්‍ර පීඨය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය</td></tr>
<tr><td>මහාචාර්ය උපාලි පන්නිලගේ ( 14.08.2023 දක්වා )<br>BA (Hons) (Ruhuna), PGDip. (Colombo), MPhil (Ruhuna), PhD (Ruhuna)<br>අයි. රේනුක ප්‍රියන්ත මහතා (15.08.2023 සිට )<br>BA (Peradeniya), PG Dip. (Bradford), MPhil (Bergen).</td><td>පීඨාධිපති, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය, රුහුණු විශ්වවිද්‍යාලය</td></tr>
</table>

| | | |
|---|---|---|
| **මහාචාර්ය එම් එම් ගුණතිලක**<br>*B.A.(Kel.), M.A. (USJ), Ph.D. (Kel. & Cambridge, UK)* | පීඨාධිපති, සමාජ විද්‍යා පීඨය,කැලණිය විශ්වවිද්‍යාලය | |
| මහාචාර්ය ලක්ෂ්මන් දිසානායක<br>*B. Dev.S (Colombo), PG Diploma (Colombo), MA (Vrije Universitiet Brussels, Belgium), PhD (University of Adelaide Australia), FRSA (United Kingdom)* | විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පත්කරන සාමාජිකයින් 4 දෙනෙකු | |
| මහාචාර්ය ඩබ්ලිව් එම් පී ඩී බණ්ඩාර<br>*BA (Peradeniya), MPhil (Peradeniya), PhD (PGIAR)* | | |
| මහාචාර්ය සමන් චන්ද්‍ර රණසිංහ ( *01.06.2023 දක්වා*)<br>*BA (Hons); MA; PhD (USJ)*<br>මහාචාර්ය පින්නවල සගසුමන හිමි (*02.06.2023 දක්වා*)<br>*BA (Hons); MA (USJ); PhD (USJ-Uppsala)* | | |
| ආචාර්ය දුෂ්යන්ති රාජසූරියර්<br>( *01.06.2023 දක්වා* )<br>*B.A (Hons) (Jaffna), M.Phil (P'deniya), PhD (Norwich, UK)*<br>මහාචාර්ය ටී. සනදානන් ( *21.07.2023 සිට*)<br>*BFA, MFA (Delhi, India), PhD (JNU, Delhi)* | | |

**2.2.** <u>කළමනාකරණ සභාවේ ව්‍යවස්ථාපිත රැස්වීම්</u>

එන්.සි.ඒ.එස්. (NCAS ) හි පරිපාලන හා අධ්‍යයන අධිකාරිය වන කළමනාකරණ සභාව වසරකට අවම වශයෙන් හය වතාවක් රැස්වේ.

| | | |
|---|---|---|
| **වගුව 02 - කළමණාකරණ සභාවේ සාමාජික සංයුතිය.** | | |
| **ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ප්‍රේමකුමාර ද සිල්වා** ( *31.01.2023 දක්වා*)<br>*BA, MA (Cmb), MSc & PhD (Edinburgh, UK)*<br>**මහාචාර්ය ප්‍රශාන්ති නාරංගොඩ මිය** ( *01.02.2023 සිට*)<br>*BA (Hons) (Kel.), MSc (PGIAR, Kel.), PhD (Cali. USA)* | අධ්‍යක්ෂ කළමනාකරණ සභාවේ සභාපති | |
| මහාචාර්ය එන් එස් පුංචිහේවා<br>*LLB (Colombo), LLM (MIPLC, Germany), PhD (University of Munich, Germany)* | පීඨාධිපති, නීති පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය | විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ස්ථාවර කමිටු විසින් නම් කරන ලද මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා විෂයයන්ට අදාළ පීඨාධිපතිවරුන් හය දෙනෙකු |
| ආචාර්ය ඊ.එම්.පී.සී.එස්. ඒකනායක<br>*B.A. Hons. (Peradeniya), PGDE (Peradeniya), M.Ed. (Sussex, UK), M.Phil. (Colombo), and Doctor of Education (Leicester, UK).* | පීඨාධිපති, ශාස්ත්‍ර පීඨය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය | |
| ජ්‍යෙෂ්ඨ මහාචාර්ය එල් මානවඩු<br>*BA (Colombo), M.Sc (A.I.T, Thailand), Ph.D (Colombo)* | ශාස්ත්‍ර පීඨය කොළඹ විශ්වවිද්‍යාලය | |

| | | |
|---|---|---|
| **මහාචාර්ය ශිරන්ත හීන්කෙන්ද**<br>*BA (Hons); PGD in Statistics (USJ); MSSc (Kelaniya); MA (GRIPS-Tokyo); PhD (Nagoya)* | පීඨාධිපති, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය | අදාළ වේ |
| **මහාචාර්ය එම් එම් ගුණතිලක**<br>*B.A.(Kel.), M.A. (USJ), Ph.D. (Kel. & Cambridge, UK)* | පීඨාධිපති, සමාජ විද්‍යා පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය | |
| **මහාචාර්ය එස් කුගමූර්ති** ( *2023 පෙබරවාරි දක්වා*) | පීඨාධිපති, අධ්‍යාපන පීඨය, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය | |
| **මහාචාර්ය ඕ. ජී.ඩී බන්ඩා**<br>*B.A. Hons. (Peradeniya), MPhil (Peradeniya)* | විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පත්කරන සාමාජිකයින් 4 දෙනෙකු | |
| **මහාචාර්ය ආර්. එම්. කේ. රත්නායක**<br>*BA. Hons (SJP), M.Phil (SJP) M.Sc. (USJ), Ph.D. (SJP/Uppsala)* | | |
| **මහාචාර්ය එම්. ජී. එල් ආනන්ද**<br>*BA (P'deniya), BA Hons. (Kel.), MA (JNU, India), MPhil (JNU, India), PhD (JNU, India)* | | |
| **මහාචාර්ය විමල් හේවාමාන්නගේ**<br>*BA Hons. (Kelaniya), MA (Kelaniya), MPhil (Kelaniya), PhD (Wuhan University, China)* | | |

රැස්වීම සඳහා ගණපූරණය මුළු සාමාජිකත්වයෙන් තුනෙන් එකකි.

### 3. මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා පිළිබඳ උසස් අධ්‍යයන සඳහා ජාතික මධ්‍යස්ථානය (NCAS) හි යහපාලනය

2023 වර්ෂය තුළ සිදු කරන ලද සියලුම කාර්යයන්හි ඉහළම ප්‍රමිතීන්ට අනුකූලව යහ පාලන භාවිතයන් ඇති කිරීමට එන්.සි.ඒ.එස්. කැපවී සිටී. මෙය අදාළ ව්‍යවස්ථාපිත විධිවිධානවලට අනුකූල වීම වැඩිදියුණු කිරීමට කටයුතු කරමින් සිටින අතර ගනුදෙනුවල විනිවිදභාවය සහ වගවීම සහ රජයේ අරමුදල් සඳහා වගකීම වැඩි දියුණු කිරීම ද මීට ඇතුලත් වේ.

#### 3.1) රජයේ මූල්‍ය රෙගුලාසි සහ රජයේ ක්‍රියා පටිපාටිවලට අනුකූල

මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා පිළිබඳ උසස් අධ්‍යයන සඳහා ජාතික මධ්‍යස්ථානය(NCAS) සම්පූර්ණයෙන්ම අරමුදල් සපයන රජයේ ව්‍යවස්ථාපිත ආයතනයක් බැවින්, සියලුම මූල්‍ය ගනුදෙනු සිදු කරනු ලබන්නේ රජයේ මූල්‍ය රෙගුලාසි, භාණ්ඩාගාර චක්‍රලේඛ සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් වරින් වර නිකුත් කරන ලද මාර්ගෝපදේශ සහ චක්‍රලේඛවලට අනුකූලව වේ.

3.1.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති (SLPSAS), ලංකා ගිණුම්කරණ ප්‍රමිති (LKAS) සහ ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති (IFRS)

මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා පිළිබඳ උසස් අධ්‍යයන සඳහා ජාතික මධ්‍යස්ථානය NCAS හි මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට (SLPSAS) අනුකූලව සකස් කර ඉදිරිපත් කරනු ලැබේ. ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති (SLPSAS) හඳුන්වා දී නොමැති ගනුදෙනු වාර්තා කිරීමේදී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (LKAS) සහ ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති (IFRS) අනුව කටයුතු කරනු ලැබේ.

3.2) **රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ**

ශ්‍රී ලංකාවේ රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට අනුකූලව වසර තුළ සියලුම භාණ්ඩ හා සේවා ලබාගෙන ඇත. එන්.සී.ඒ.එස්. හි කළමනාකරණ සභාව විසින් ප්‍රසම්පාදන කමිටුව සහ තාක්ෂණික ඇගයීම් කමිටුව පත් කරන ලදී. කාරක සභා සඳහා සාමාජිකයින් පහත පරිදි සේවය කළහ.

**දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (මහා පරිමාණ )**

1. **ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ප්‍රේමකුමාර ද සිල්වා /**වැඩබලන අධ්‍යක්ෂ**/**NCAS( 31.01.2023 **දක්වා)**
   **මහාචාර්ය ප්‍රශාන්ති නාරංගොඩ මිය** ( 01.02.2023 **සිට)**
2. තුෂාරා මහානාම මිය ප්‍රධාන ගනකාධිකාරී අධ්‍යාපන අමාත්‍යාංශය
3. ටී. එලංවෙලියපල්ලවන් ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී NCAS

**දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (සුළු පරිමාණ)**

1. **ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ප්‍රේමකුමාර ද සිල්වා /**වැඩබලන අධ්‍යක්ෂ**/**NCAS( 31.01.2023 **දක්වා)**

   **මහාචාර්ය ප්‍රශාන්ති නාරංගොඩ මිය (** 01.02.2023 **සිට)**
2. .එස් වික්‍රමාරච්චි මහතා ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් / සාමාන්‍ය පරිපාලන/ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
3. ජී. ආර්. කේ. එස් ගනේගොඩ මහතා ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී ( වැඩබලන) (NCAS)

## තාක්ෂණික ඇගයීම් කමිටුව

**භාන්ඩ ප්‍රසම්පාදන**

ජී. ආර්.කේ.එස් ගනේගොඩ මහතා ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී (වැඩබලන) (NCAS)

ආචාර්ය සම්පත් චන්ද්‍රසේන, ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති/NCAS *( 01.08.2023සිට)*
ආචාර්ය සම්පත් චන්ද්‍රසේන /තොරතුරු තාක්ෂන උපදේශක/NCAS *( 31.07.2023 සිට)*

මහාචාර්ය විමල් හේවාගමගේ, බෞද්ධ අධ්‍යන දෙපාර්තමේන්තුව කොළඹ විශ්වවිද්‍යාලය

**NCAS පරිශ්‍රය ප්‍රතිසංස්කරනය**

කේ. ඒ.පී ගුනරත්න මහතා / වැඩ ඉංජිනේරු/ කැලණිය විශ්වවිද්‍යාලය

ජී.ඩී දමිත් පෙරේරා මහතා / වැඩ ඉංජිනේරු /විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

ඉංජිනේරු ආර්.බී. එම් ගුනවර්ධන/ නි.වි.නි / ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය

**3.3** විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහය සහ බඳවා ගැනීමේ යෝජනා ක්‍රමය.

වැටුප්, පත්වීම්, උසස්වීම්, වර්ධක සහ නිවාඩු ඇතුළු සියලුම කාර්ය මණ්ඩල කටයුතු විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහයේ සහ බඳවා ගැනීමේ ක්‍රමයේ විධිවිධානවලට අනුකූලව පාලනය කර ඇත. විශ්වවිද්‍යාල පද්ධතියට අදාළ වන පරිදි මුදල් අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුගත කරගන්නා ලද චක්‍රලේඛ කාර්ය මණ්ඩලයේ වැටුප් සහ දීමනා සඳහා ද උපකාරී කොටගෙන ඇත.

**3.4 අපේක්ෂකයින් තෝරා ගැනීම සහ පශ්චාද් උපාධි ශිෂ්‍යත්ව පිරිනැමීම සඳහා මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා පිළිබඳ උසස් අධ්‍යයන සඳහා ජාතික මධ්‍යස්ථානය NCAS මාර්ගෝපදේශ**

කළමනාකරණ සභාවේ නිර්දේශ සහිතව වරින් වර යාවත්කාලීන කරනු ලබන ස්ථාපිත මාර්ගෝපදේශයන්ට අනුව ආචාර්ය උපාධි ශිෂ්‍යත්ව සඳහා අපේක්ෂකයින් තෝරා ගනු ලැබේ. ශිෂ්‍යත්ව පිරිනැමීම සඳහා තේරීම් කමිටු පත්කරනු ලබන්නේ ද කළමනාකරණ සභාවේ අනුමැතියට යටත්ව ය. තේරීම් කමිටු සංයුතිය පහත පරිදි වේ.

1. අධ්‍යක්ෂ - තේරීම් කමිටුවේ සභාපති ලෙස
2. කළමනාකරණ සභාවේ සාමාජිකයෙක් (විනිවිදභාවය පවත්වා ගැනීම සඳහා ප්‍රදාන සඳහා අයදුම්කරුවන් නොමැති විශ්ව විද්‍යාලයේ සාමාජිකත්වයෙන් තෝරාගෙන ඇත).
3. ප්‍රදාන සඳහා අයදුම්කරුවන් නොමැති රාජ්‍ය විශ්ව විද්‍යාල වල ආරාධිත ජ්‍යෙෂ්ඨ සාමාජිකයන් දෙදනෙක්
4. මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා පිළිබඳ උසස් අධ්‍යයන සඳහා ජාතික මධ්‍යස්ථානය NCAS හි පර්යේෂණ නිලධාරි

රජයේ විශ්වවිද්‍යාලවල අධ්‍යන නිවාඩු හිමිකම් සහිත ස්ථිර අධ්‍යන කාර්යමණ්ඩලයේ සාමාජිකයින් NCAS හි පශ්චාත් උපාධි ශිෂ්‍යත්ව වැඩසටහන සඳහා සුදුසුකම් ලබයි. අපේක්ෂකයින්ට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාදෙන ලද ශාස්ත්‍රපති උපාධියක් සහ වලංගු ස්ථානගත කිරීමක් (valid placement)තිබිය යුතුය

එක් අපේක්ෂකයෙකුට වසරකට ලැබෙන ප්‍රදාන ප්‍රමාණය පහත පරිදි තීරණය වේ:

- දේශීය විශ්වවිද්‍යාලවල ලියාපදිංචි වූ අයදුම්කරුවන් සම්බන්ධයෙන්, නිල ආයතනික ගාස්තු සහ පර්යේෂණ වියදම් මත පදනම්ව වසරකට ප්‍රදාන ප්‍රමාණය තීරණය කරනු ලැබේ
- විදේශීය විශ්ව විද්‍යාලවල ලියාපදිංචි වූ අපේක්ෂකයින් සම්බන්ධයෙන්, එක් පුද්ගලයෙකුට වසරකට ප්‍රදාන ප්‍රමාණය නිල ආයතනික ගාස්තුව සහ රට අනුව සම්මත ජීවන දීමනාව මත පදනම්ව තීරණය කරනු ලැබේ. මෙම කාණ්ඩය යටතේ වසරකට උපරිම ආධාර මුදල රුපියල් මිලියන 2.0 කි.

දළ දේශීය නිෂ්පාදිතයේ 2018 අප්‍රේල් ඒක පුද්ගල ආදායම (IMF) අනුව වසරකට යෝජිත සංශෝධිත ජීවන දීමනාව පහත පරිදි වේ.

වගුව 03 සංශෝධිත ජීවන දීමනාව

| වර්ගීකරණ අංකය | ද.දේ.නි. ආදායම 2018 වර්ෂය (ඇ.ඩො) | උපරිම ජීවන දීමනාව වසරකට (රු) | රටවල් |
|---|---|---|---|
| වර්ගීකරණ 1 | 25,000 > above | 1,500,000.00 | කොරියාව, ඕස්ට්‍රේලියාව, එක්සත් රාජධානිය, නවසීලන්තය, ජපානය, ජර්මනිය, ඇමරිකා එක්සත් ජනපදය, නෙදර්ලන්තය, ප්‍රංශය, කැනඩාව,නෝර්වේ,ස්වීඩනය, ස්විට්සර්ලන්තය, තායිවානය, ඔස්ට්‍රියාව, සිංගප්පූරුව, හොංකොං, ඉතාලිය |
| වර්ගීකරණ 2 | 23,000 – 24,999 | 1,450,000.00 | චෙක් ජනරජය, පෘතුගාලය |
| වර්ගීකරණ 3 | 21,000 – 22,999 | 1,300,000.00 | ග්‍රීසිය |
| වර්ගීකරණ 4 | 19,000 – 20,999 | 1,200,000.00 | ස්ලෝවැක් ජනරජය, ස්ලෝවේනියාව |
| වර්ගීකරණ 5 | 17,000 – 18,999 | 1,200,000.00 | |
| වර්ගීකරණ 6 | 15,000 – 16,999 | 1,200,000.00 | චිලී, පෝලන්තය, හංගේරියාව |
| වර්ගීකරණ 7 | 13,000 – 14,999 | 1,050,000.00 | මාල දිවයින |
| වර්ගීකරණ 8 | 11,000 – 12,999 | 1,000,000.00 | රුසියාව, මැලේසියාව, තුර්කිය |
| වර්ගීකරණ 9 | 9,000 – 10,999 | 950,000.00 | බ්‍රසීලය, චීනය, මෙක්සිකෝව |
| වර්ගීකරණ 10 | 7,000 – 8,999 | 850,000.00 | |
| වර්ගීකරණ 11 | 5,000 – 6,999 | 800,000.00 | තායිලන්තය,කොලොම්බියාව, දකුණු අප්‍රිකාව |
| වර්ගීකරණ 12 | 3,000 – 4,999 | 750,000.00 | ජෝර්ජියාව,ශ්‍රීලංකාව,ඉන්දුනීසියාව, පිලිපීනය, භූතානය |
| වර්ගීකරණ 13 | 3,000 or below | 700,000.00 | වියට්නාමය,ඉන්දියාව,පකිස්ථානය, බංග්ලාදේශය, නේපාලය, කැමරූන් |

මූලාශ්‍රය: *IMF දත්ත පද්ධතිය අප්‍රේල්, 2018 (World Economic Outlook Database)*

## වැඩමුළු/පාඨමාලා/ඉදිරිපත් කිරීම්

2023 වර්ෂය තුළ මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා පිළිබඳ උසස් අධ්‍යයන සඳහා ජාතික මධ්‍යස්ථානය විසින් ප්‍රවර්තන සිදුවීම් මත පහත ඉදිරිපත් කිරීම්, පාඨමාලා සහ වැඩමුළු පවත්වන ලදී.

වැඩසටහන් පිළිබඳ විස්තර පහත පරිදි වේ.

### වගුව 05: 2023 දී පවත්වන ලද වැඩමුළු/පාඨමාලා/ඉදිරිපත් කිරීම් වල සාරාංශය

| අංක | වැඩමුළු | පවත්වන ලද දිනය | ඉලක්ක කණ්ඩායම | සහභාගීත්වය | විශේෂ කරුණු |
|---|---|---|---|---|---|
| 01. | පර්යේෂණ සඳහා NVivo භාවිතා කිරීම පිළිබඳ වැඩමුළුව | 2023 මැයි 20 - 21 | විශ්වවිද්‍යාල අධ්‍ය කාර්ය මණ්ඩල විධායක | 5 | සම්පූර්ණ කරනලදි |
| **No.** | **ආරාධිත දේශනය** | **පවත්වන ලද දිනය** | **ඉලක්ක කණ්ඩායම** | **සහභාගීත්වය** | **විශේෂ කරුණු** |
| 02. | දකුනු ආසියාවේ සෞන්දර්ය හා සංස්කෘතික සංවර්ධනය සඳහා රවීන්ද්‍රනාත් තාගෝර් ගේ බලපෑම පිළිබඳ ආරාධිත දේශනය | 2023 මැයි 09 | විශ්වවිද්‍යාල අධ්‍යයන කාර්ය මණ්ඩලය, ප්‍රතිපත්ති සම්පාදකයින් සහ පර්යේෂකයින් | 52 | සම්පූර්ණ කරනලදි |
| 03. | ශ්‍රී ලංකා ආර්ථික අර්බුදය, විවෘත බුද්ධිමය සංවාදයක් පිළිබඳ වෙබ් සංදර්ශකය | 2023 නොවැම්බර් 16 | විශ්වවිද්‍යාල අධ්‍යයන කාර්ය මණ්ඩලය, ප්‍රතිපත්ති සම්පාදකයින් සහ පර්යේෂකයින් | 32 | සම්පූර්ණ කරනලදි |

## ගුණාත්මක පර්යේෂණ සඳහා NVivo භාවිතා කිරීම පිළිබඳ වැඩමුළුව

මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යාව පිළිබඳ උසස් අධ්‍යයන සඳහා ජාතික මධ්‍යස්ථානය විසින් ගුණාත්මක පර්යේෂණ සඳහා NVivo භාවිතා කිරීම පිළිබඳ වැඩමුළුව 2023 ජනවාරි සිට ආරම්භ කරන ලදී. එක් පාඨමාලාවක් සඳහා සහභාගිවන්නන් 15 දෙනෙකු බැගින් ඇතුලත් කරගන්නා ලදී.ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ කළමණාකරන පීඨයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය මනෝජ් සමරතුංග මහතා සම්පත් දායකත්වය දරන ලදී.පාඨමාලා සම්බන්ධීකරනය එන්.සි.ඒ.එස්. ආයතනයේ ( NCAS) තොරතුරු තාක්ෂන උපදේශක ආචාර්ය සම්පත් චන්ද්‍රසේන මහතා විසින් සිදුකරන ලදී.

## වාර්ෂික පර්යේෂණ සම්මන්ත්‍රණය-2023

කොවිඩ් - 19 වසංගතය සහ ආර්ථික අර්බුදයෙන් පසු **NCAS** විසින් ප්‍රථම ප්‍රධාන ක්‍රියාකාරකම වශයෙන් 05 වැනි ජාත්‍යන්තර පර්යේෂණ සම්මන්ත්‍රණය පවත්වන ලදී. එහි ආරම්භක අධ්‍යක්ෂ දිවංගත මහාචාර්ය සේනක බණ්ඩාරනායක මහතාගේ කෘතීන් නැවත බැලීම තුලින් තෝරාගත් තේමාව වූයේ ‘‘සංස්කෘතිය සහ උරුමය ප්‍රතිෂ්ඨාපනය කිරීම තුළින් තිරසාරත්වය’’ යන්නයි

විස්තීරණ සාරාංශ 100+ අතරින්, 52ක් ඉදිරිපත් කරන ලදී. ප්‍රධාන දේශනය ආචාර්ය Lodewijk Wagenar විසින් පවත්වන ලද අතර, ජාතික හා ජාත්‍යන්තර වශයෙන් කීර්තිමත් විද්වතුන්ගේ සහභාගීත්වයෙන් කමිටු සාකච්ඡාවක් පවත්වන ලදී.

**උප තේමා**

1. ස්පර්ශ කළ හැකි සහ අස්පෘශ්‍යා සංස්කෘතික උරුමය: ඉල්ලා සිටින අනන්‍යතාවයේ ප්‍රත්‍යාවර්තනයක්
2. ආගම සහ සමාජය: විද්‍යාවෙන් ඔබ්බට ගිය දර්ශනයක්, මිථ්‍යාව සහ යථාර්ථය
3. නිදහස, අයිතිවාසිකම් සහ සිවිල් වගකීම් එදිරිව නීති සම්පාදනය සහ සමාජ සාධාරණත්වය
4. සංහිදියාව, දේශපාලනය සහ සමාජය.
5. පරිසරය සහ පරිසර විද්‍යාව: සෞඛ්‍ය සම්පන්න ජීවනෝපායක් සම්ප්‍රේෂණය කිරීම.
6. තිරසාර සංවර්ධනය සහ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ගේ කාර්යභාරය
7. සංචාරක: කර්මාන්තයක් හෝ කලාවක්.
8. ඉගැන්වීමේ සහ ඉගෙනීමේ ඩිජිටල් මෙවලම්වල කාර්යභාරය: භාෂා ඉගෙනීම සඳහා බොහෝ දුරස් වේ.
9. සත්‍ය විද්‍යාව සහ තාක්ෂණය
10. AI (කෘතිම බුද්ධිය) සහ ඩිජිටල් ප්‍රතිසාධනය

වාර්ෂික පර්යේෂණ සම්මන්ත්‍රණය-2023 - ඡායාරූප කිහිපයක්










2023
IRSSSH
Sri Lanka


InFocus


SYMPOSIUM PROCEEDINGS
(IRSSSH)-2023
National Center for Advanced Studies in
Humanities and Social Sciences
NCAS
2023
9789554978102
SYMPOSIUM PROCEEDINGS
5th International Research Symposium on
Social Sciences & Humanities
(IRSSSH)-2023
"Sustainability Through
Reconciliation of
Culture and Heritage"
29, November 2023
Sri Lanka Foundation Institute
Colombo
National Centre for Advanced Studies in
Humanities and Social Sciences
NCAS

## එන්.සි.ඒ.එස්. ආයතනයේ තොරතුරු තාක්ෂණ සම්පත්

බහුමාධ්‍ය පහසුකම් මෙම විද්‍යාගාරය විශ්වවිද්‍යාල ආචාර්යවරුන්, විධායකයින් සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලය පරිගණක යෙදුම් කිහිපයක් පිළිබඳ පුහුණු කිරීම, SPSS භාවිතයෙන් දත්ත විශ්ලේෂණය, ව්‍යුහාත්මක සමීකරණ ආකෘති නිර්මාණය සඳහා AMOS, ප්‍රමාණාත්මක පර්යේෂණ සඳහා EViews, ගුණාත්මක පර්යේෂණ සඳහා NVIVO ආදිය සඳහා භාවිතා වේ. ප්‍රදාන කළමනාකරණ දත්ත සමුදා මෘදුකාංගය ප්‍රදාන කළමනාකරණ තොරතුරු අධීක්ෂණය සහ සැපයීම සඳහා භාවිතා කරයි.

- 2023 වර්ෂය තුළ තොරතුරු තාක්ෂණ අංශය විසින් සිදු කරන ලද ක්‍රියාකාරකම් පහත පරිදි වේ.
- ආයතනය සඳහා තාක්ෂණික පිරිවිතර, ව්‍යාපෘති යෝජනා සහ තාක්ෂණික වාර්තා සංවර්ධනය කිරීම
- Windows Server සහ LINUX Server සහ Routers වැනි අදාළ උපකරණ ස්ථාපනය කිරීම, ක්‍රියාත්මක කිරීම, වින්‍යාස කිරීම, කළමනාකරණය කිරීම සහ නඩත්තු කිරීම
- සර්වර් සහ වර්ක්ස්ටේෂන් Servers and Workstations මත මෘදුකාංග ස්ථාපනය කර ඒකාබද්ධ කිරීම
- සේවාදායක කළමනාකරණය-ගොනු සහ මුද්‍රණ සේවාදායක, සේවාදායක අථත්‍යකරණය,මූලික මෙහෙයුම් පද්ධති ප්‍රමිතීන්, මෙහෙයුම් පද්ධති වැඩිදියුණු කිරීම් සහ නඩත්තුව, උපස්ථ / ප්‍රතිසාධනය, සහ සේවාදායක දෘඩාංග වින්‍යාස කිරීම් වැනි සේවාදායකය ආශ්‍රිත කාර්යයන් සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම
- අධීක්ෂණය - නිරීක්ෂණ සහ විශ්ලේෂණ මෙවලම් පිළිබඳ නිර්දේශ සකස් කිරීම. අධීක්ෂණ මෙවලම් සැලසුම් කර ක්‍රියාත්මක කිරීම. උපස්ථ සහ ජාල දෝශ නිරාකරණය සිදු කිරීම
| 2023 ජනවාරි 01 දිනට ශේෂය | **48,851,361** | **6,620,506** | **(17,750,927)** | **25,685,301** | **6,485,119** | **2,418,825** | **3,848,882** | **76,159,068** |
| නැවත වර්ගීකරනය - SLPSAS ii අනුව | (48,851,361) | ~ | ~ | 48,851,361 | ~ | ~ | ~ | ~ |
| නැවත වර්ගීකරනය - SLPSAS ii | ~ | (6,620,506) | ~ | 6,620,506 | ~ | ~ | ~ | ~ |
| | | | (226,521) | | | 113,260 | 113,260 | ~ |
| නැවත වර්ගීකරනය - SLPSAS ii | ~ | ~ | 17,977,448 | ~ | (17,977,448) | ~ | ~ | ~ |
| 2023 ජනවාරි 01 දිනට ශේෂය | **~** | **~** | **~** | **81,157,168** | **(11,492,329)** | **2,532,085** | **3,962,142** | **76,159,068** |
| පෙර වර්ෂ ගැලපීම් | ~ | ~ | ~ | 259,026 | 10,026,964 | ~ | ~ | 10,285,990 |
| වර්ෂයේ අතිරික්තය/ඌනතාවය | - | - | ~ | 13,947,620 | 10,381,465 | ~ | ~ | 24,329,085 |
| 2023 දෙසැම්බර් 31 දිනට ශේෂය | **~** | **~** | **~** | **95,363,814** | **8,916,099** | **2,532,085** | **3,962,142** | **110,774,141** |

## මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යාව පිළිබඳ උසස් අධ්‍යයන සඳහා වූ ජාතික මධ්‍යස්ථානය (එන්.සි.ඒ.එස්.)
## මුදල් ප්‍රවාහ ප්‍රකාශනය
## 2023 දෙසැම්බර් 31 දිනට

| | 2023 | 2022 |
|---|---|---|
| | | නැවත ප්‍රකාශිත |
| | රු. | රු. |
| **මෙහෙයුම් ක්‍රියාවලියෙන් ජනිත/ (යොදවන ලද) මුදල් ප්‍රවාහය** | | |
| වර්ෂය සඳහා අතිරික්තය/ (ඌනතාව) | 24,329,085 | 32,170,420 |
| **ගැලපීම්** | | |
| ක්ෂය | 2,141,999 | 2,390,421 |
| විශ්‍රාම ප්‍රතිලාභ ප්‍රතිපාදන | 664,510 | 717,309 |
| පෙර වර්ෂය සඳහා ගැලපීම් | 10,063,644 | 15,347,751 |
| මෙහෙයුම් අතිරික්තය - කාරක ප්‍රාග්ධන වෙනස්වීම් වලට පෙර | **37,199,238** | **50,625,902** |
| **කාරක ප්‍රාග්ධනයේ වැඩිවීම/අඩුවීම** | | |
| තොග | (128,477) | (139,068) |
| පොදු ලැබියයුතු | (845,232) | (183,693) |
| ලැබියයුතු ප්‍රදාන ආචාර්ය/දර්ශනපති | (1,500,000) | - |
| **තැන්පතු සහ ගෙවීම්** | (1,773,697) | (192,264) |
| **උපචිත වියදම්** | (678,614) | (183,838) |
| **ගෙවියයුතු වියදම්** | (13,696,317) | (7,429,087) |
| **වෙළඳ ණයහිමියෝ** | - | (23,750) |
| **විලම්භිත ආදායම්** | 103,000 | (130,000) |
| මෙහෙයුම් කටයුතු වලින් ජනිත මුදල් ප්‍රවාහය | **(18,519,337)** | **(8,281,700)** |
| ආදායම්බදු ගෙවීම් | - | - |
| පාරිතෝශික ගෙවීම් | (547,841) | (1,316,662) |
| පොලී ගෙවීම් | - | - |
| මෙහෙයුම් කටයුතුවලින් ජනිත ශුද්ධ මුදල් ප්‍රවාහය | 18,132,060 | 41,027,540 |
| **ආයෝජන ක්‍රියාවලියෙන් ජනිත/ (යොදවන ලද) මුදල් ප්‍රවාහය** | | |
| ස්ථාවර තැන්පතු ආයෝජන | (48,800,115) | (1,655,014) |
| දේපල පිරියත හා උපකරන අත්පත්කරගැනීම් | (3,698,045) | (299,448) |
| ආයෝජන කටයුතුවල යොදවන ලද ශුද්ධ මුදල් ප්‍රවාහය | (52,498,160) | (1,954,462) |
| **මූල්‍ය කටයුතුවලින් ජනිත/යොදවන ලද මුදල් ප්‍රවාහය** | | |
| වර්ෂය තුල ලද අරමුදල් | - | - |
| මූල්‍ය කටයුතුවලින් ජනිත/යොදවන ලද මුදල් ප්‍රවාහය | - | - |
| මුදල් හා මුදල් සමානදෑ ශුද්ධ අඩුවීම/ වැඩිවීම | (34,366,100) | 39,073,078 |
| වර්ෂය ආරම්භයේ මුදල් හා මුදල් සමානදෑ | 71,262,229 | 32,189,151 |
| **වර්ෂය අවසානයේ මුදල් හා මුදල් සමානදෑ** | **36,896,129** | **71,262,229** |

## ගිණුම්කරන ප්‍රතිපත්ති

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

**1. ස්ථාපනය පිළිබඳ තොරතුරු**

1.1 ස්ථාපනය හා නීතිමය ආකෘතිය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ විධිවිධාන ප්‍රකාරව 2005 ඔක්තෝබර් අංක 1415/17 දරන ආඥාපනත යටතේ පිහිටුවන ලද මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යාව පිළිබඳ උසස් අධ්‍යයන සඳහා වූ ජාතික මධ්‍යස්ථානය (එන්.සි.ඒ.එස්.), ශ්‍රී ලංකාවේ පිහිටුවන ලදී. මධ්‍යස්ථානය 6A, සුබස්තාන් උද්‍යාන, වෝඩ් පෙදෙස, කොළඹ 07 යන ලිපිනයේ පිහිටුවා ඇත.

1.2 ප්‍රධාන කාර්යයන් සහ නීතිමය ස්වභාවය

මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා ක්ශේත්‍රයේ උසස් අධ්‍යාපනය හා පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම.රජයේ අරමුදල් මගින් මෙම මධ්‍යස්ථානය මෙහෙයුම් කටයුතු සිදුකරයි. මධ්‍යස්ථානය මගින් විශ්වවිද්‍යාල ආචාර්යවරුන් සඳහා ආචාර්ය උපාධි/ දර්ශනපති උපාධි සඳහා ප්‍රදාන පිරිනැමීම සිදුකරනු ලබයි.

1.3 මූල්‍යකාළපරිච්ඡේදය

2023 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා කාලය මධ්‍යස්ථානයේ මූල්‍ය කාළපරිච්ඡේදය වේ.

1.4 සේවක සංඛාව

2023 දෙසැම්බර් 31 දිනට මධ්‍යස්ථානයේ අනුමත කාර්යමණ්ඩලය 14 ක් හා පවත්නා කාර්යමණ්ඩලය 08 ක් වේ.

**2. මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ පදනම**

2.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ පදනම

මූල්‍ය ප්‍රකාශන උපචිත හා ඓතිහාසික පිරිවැය පදනමින් පිළියෙල කරනු ලැබේ.

2.2 අනුගතවීම

මධ්‍යස්ථානයේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් හඳුන්වාදෙන ලද රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කරනු ලැබේ. ගණුදෙනුවක් හා සම්බන්ධ වන රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති නොමැති හා මධ්‍යස්ථානයේ ඒවැනි ගිණුම් ශේෂයක් පවතින අවස්ථා වලදී ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරන ප්‍රමිති හා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වල අදාල විධිවිධාන අනුකූලව මූල්‍ය ප්‍රකාශනපිළියෙල කර ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇත. ගිණුම්කරණ ප්‍රතිපත්ති පසුගිය මූල්‍ය වර්ෂ වල භාවිතා කරන ලද ප්‍රතිපත්ති හා අනුගත වේ.

2.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ වගකීම

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම මධ්‍යස්ථානයේ කළමණාකරනයේ වගකීම වේ.

2.4 අඛන්ඩ පැවැත්ම

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී කළමණාකරනය මධ්‍යස්ථානය අඛන්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තක්සේරු කරන ලදී. පූර්වේක්ෂනය කල හැකි අනාගතයක් දක්වා මධ්‍යස්ථානය පවත්වාගෙන යාමට ප්‍රමානවත් සම්පත් මධ්‍යස්ථානය සතුව පවතින බවට කළමණාකරනය වගකීමෙන් අපේක්ෂා කරයි. සියලුම පවත්නා තොරතුරු සැලකිල්ලට ගැනීමේදී මධ්‍යස්ථානය විසුරුවා හැරීමේ හෝ ඒහි මෙහෙයුම් කටයුතු නැවැත්වීමේ

අවශ්‍යතාවයක් පැන නොනගින බවට මධ්‍යස්ථානය අපේක්ෂා කරයි. ඒ අනුව මධ්‍යස්ථානය මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අඛන්ඩ පැවැත්ම පදනම දිගින් දිගටම යොදාගනී.

2.5 ශේෂපත්‍ර දිනට පසු සිදුවීම්

මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කලයුතු හෝ ගැලපීම් කලයුතු ශේෂපත්‍ර දිනට පසු ප්‍රමාණාත්මක සිදුවීම් නොමැත.

2.6 සංසන්දනාත්මක සංඛ්‍යා

මෙම ඉදිරිපත් කිරීම තහවුරු කිරීම සඳහා සංසන්දනාත්මක සංඛ්‍යා නැවත සකස් කරන ලදී.

**3. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සාරාංශය**

3.1 වත්කම් සහ ඒවා අගය කිරීමේ පදනම

දේපල පිරියත හා උපකරණ ඒවායේ ශුද්ධ අගයට වාර්තා කර ඇත. දේපල පිරියත හා උපකරණ මිලදී ගැනීමේ හෝ ඉදිකිරීමේ පිරිවැයට ඒවායේ මූලික පිරිවැයද ඇතුලත්ව දැක්වේ.

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 07 අනුව ක්ෂය වත්කම් භාවිතය සඳහා සුදුසු වූ දිනට දක්වා ඇත. දේපල පිරියත හා උපකරණ ඒවායේ පිරිවැයට පහත රේටයන්ට දක්වා ඇත.

| වත්කම් | ක්ෂය - වර්ෂයකට (%) |
|---|---|
| ගොඩනැගිලි | 5 |
| ලී බඩු හා උපකරණ | 10 |
| කාර්යාල උපකරණ | 20 |
| පරිගනක හා මුර්දුකාංග | 20 |
| පුස්තකාල පොත් | 20 |

(කොමිෂන්සභා චක්‍රලේඛ අංක 649 පදනම් කරගෙන ඉහත රේටයන් තීරනය කර ඇත.)

3.2 ඉන්වෙන්ටරි

ඉන්වෙන්ටරි භාන්ඩ පිරිවැය පදනම හා ප්‍රථම ලැබීම් ප්‍රථම නිකුත්කිරීමේ පදනම මත අගය කර ඇත.

3.3 ලැබියයුතු දෑ

1. ලැබියයුතු දෑ තක්සේරු කරන ලද උපලබ්ධි අගයට දක්වා ඇත.

3.4 කාර්යමණ්ඩල ණය

අ) ලංකා ගිණුම්කරණ ප්‍රමිති 39 අනුව කාර්යමණ්ඩල ණය ක්‍රමක්ෂය පිරිවැය ක්‍රමයට දක්වා ඇත.ඒ අනුව මූල්‍ය උපකරන හඳුනාගැනීම සහ පලදායී පොලී අනුපාත භාවිතයෙන් ඇගයීම වානිජ බැංකුවල පවතින පහත දැක්වෙන අනුපාත හා සමාන වේ.

2022 18.00%

2023 14.21%

ආ) කලින් ගෙවන ලද කාර්යමණ්ඩල වියදම්

මෙය මධ්‍යස්ථානයේ සේවකයින් හට සහන පොලී අනුපාත යටතේ ලබාදෙන ලද කාර්යමණ්ඩල ණය ශේෂය නිරූපනය කෙරේ.

3.5 වගකීම් සහ ප්‍රතිපාදන

ශේෂපත්‍ර දිනට තොරතුරු ඉදිරිපත්ව ඇති සියලු වගකීම් මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් වන අතර පවතින බවට තොරතුරු ඉදිරිපත්ව ඇති එහෙත් වටිනාකම නිවැරදිව තීරනය කල නොහැකි වගකීම් සඳහා ප්‍රතිපාදන සිදුකර ඇත.

I. කළමණාකරන සභාව විසින් 2023 වර්ෂයේදී අනුමත කරනලද ප්‍රදාන ගෙවියයුතු ප්‍රදාන ගිණුමට ඇතුලත් කර ඇත.

3.6 ප්‍රාග්ධන බැඳීම් සහ අසම්භාව්‍ය වගකීම්

සියලු ප්‍රමාණාත්මක බැඳීම් සහ අසම්භාව්‍ය වගකීම් සැලකිල්ලට ගෙන ඇති අතර අවශ්‍ය අවස්තාවලදී මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් සහ හෙලිදරව් කිරීම් සිදුකර ඇත.

3.7 සේවක පාරිතෝෂික

නිශ්චිත දායක සැලැස්ම

සේවකයින් සේවක අර්ථසාධක අරමුදල් දායකය, සේවක භාරකාර අරමුදල්, විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදල සඳහා අදාල නීතිරීති සහ රෙගුලාසි වලට සමගාමීව දායකත්වය දැරීමට හිමිකම් ඇත. මධ්‍යස්ථානය මූලික පාරිශ්‍රමිකයට ජීවන වියදම් දීමනාව ඒකතුකොට ස්ථිර දායකත්වයක් සේවක අර්ථසාධක අරමුදල, සේවක භාරකාර අරමුදල, විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදල සඳහා ගෙවනු ලබන අතර වෙනත් ගෙවීමක් සඳහා කිසිදු නෛතික බැඳීමක් නොමැත.

නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම

නිශ්චිත ප්‍රතිලාභ සැලැසුම් නිශ්චිත දායක සැලැසුම් මෙන් නොව පශ්චාත් සේවක සැලැසුම් වේ. 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනතේ විධිවිධාන ප්‍රකාරව මධ්‍යස්ථානය පාරිතෝෂික ගෙවීම සඳහා වගකීමක් පවතී. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 19 ප්‍රකාරව රජයේ බැඳුම්කර අනුපාතයට සමාන වට්ටම් අනුපාතය භාවිතයෙන් වර්තමාන අගය ක්‍රමය පදනම් කරගනිමින් තීරනය කරනු ලබන අතර සාමාන්‍ය වැටුප් වර්ධක අනුපාතය පහත දැක්වේ.

| වර්ෂය | බැඳුම්කර අනුපාතය | වැටුප් වර්ධක අනුපාතය |
|---|---|---|
| 2023 | 18% | 14% |
| 2022 | 18% | 14% |

3.8 කාර්යමණ්ඩල සහ ආයතනික සංවර්ධන අරමුදල

කාර්යමණ්ඩල සහ ආයතනික සංවර්ධන අරමුදල වැඩමුලු සහ අධ්‍යාපනික පාඨමාලා වලින් උපයන ලද අභ්‍යන්තර අරමුදල් මාරුකිරීම් නියෝජනය කරයි. ප්‍රමානය කළමණාකරනය විසින් තීරනය කරනු ලැබේ.

3.9 ආදායම හඳුනාගැනීම

ආර්ථික ප්‍රතිලාභ හෝ සේවාවන්ගෙන් මධ්‍යස්ථානයට වර්ෂය තුල ලැබුණු හෝ ලැබියයුතු දල ගලාඒම් සහ ශුද්ධ වත්කම් වල/ස්කන්ධයේ වැඩිවීම් වලින් ආදායම සමන්විත වේ. මධ්‍යස්ථානය SLPSAS 10 (හුවමාරු ගණුදෙනු වලින් ලද ආදායම) හා SLSAS 11 (හුවමාරු නොවන ගණුදෙනු වලින් ලද ආදායම) අනුව ආදායම හඳුනාගනී.

හුවමාරු ගණුදෙනු වලින් ලද ආදායම

(අ) ස්වයං මූල්‍යන කටයුතු වලින් ජනිත ආදායම

බාහිර වැඩසටහන් වලින් වන ස්වයං මූල්‍යන කටයුතු පිරිවැය ආවරණය කරගැනීම සහ ලාභ නොඋපයන පදනමින් සිදුකරනු ලබයි.මෙම ස්වයං මූල්‍යන කටයුතුවල පාඨමාලා ගාස්තු කාලපරිච්ඡේදය තුල දරන ලද වියදමට හඳුනාගනු ලබන අතර අනාගත වියදම් හා මූල්‍ය සංවර්ධන කටයුතු දායකය මූල්‍ය තත්ව ප්‍රකාශයේ විලම්භිත ආදායම් යටතේ දක්වා ඇත.

(ආ) අනෙකුත් ආදායම්

කාලපරිච්ඡේදය සඳහා ලද පොලී ආදායම්, පර්යේෂන සමුලු සහ ආචාර්ය / දර්ශනපති උපාධි ලියාපදිංචි ගාස්තු මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ හුවමාරු ගණුදෙනු ලෙස සටහන් කර ඇත.

හුවමාරු නොවන ගණුදෙනු ආදායම

හුවමාරු නොවන ගණුදෙනු ආදායම යනු මධ්‍යස්ථානයට හුවමාරුව සඳහා සමාන වටිනාකමක් දීමෙන් තොරව වෙනත් ආයතනයකින් ලැබුණු අගයන් වේ. ( මුදල් හෝ වෙනත් වත්කම්)

හුවමාරු නොවන ගණුදෙනු යටතේ සේවා ස්වභාවයෙන් හැර ලැබෙන සම්පත් වත්කම් ලෙස නිර්වචනය කල හැකි විට ඒවා වත්කම් ලෙස දැක්වේ.එනම් ඒවා

එය ආර්ථික ප්‍රතිලාභ හෝ සේවා ස්වරූපයෙන් මධ්‍යස්ථානයට ලැබීමක් සහ ධාරන අගය නිවැරදිව ගණනය කලහැකි අවස්ථාවකදී පමණි.

වත්කම් ලෙස හඳුනාගනු ලබන හුවමාරු නොවන ගණුදෙනු යටතේ මධ්‍යස්ථානයට ලැබෙන සම්පත් හුවමාරු නොවන ආදායම ලෙස හඳුනාගනු ලබන අතර එම ලැබීම වෙනුවෙන් වගකීමක් හඳුනාගනු නොලැබේ.

මධ්‍යස්ථානයේ හුවමාරු නොවන ගණුදෙනු වලට අදාල හඳුනාගැනීමේ පිරිවිතර පහත දැක්වේ.

(අ) රාජ්‍ය ප්‍රදාන / හුවමාරු

රාජ්‍ය ප්‍රදාන තුලින් ජනිතවන වත්කම් හා ආදායම් හුවමාරුව බැඳීමක් බවට පත්වන කාලපරිච්ඡේදයේ එහි ධාරන අගයට හඳුනාගනී. මෙම හුවමාරුව කොන්දේසි වලට යටත් වන සහ හුවමාරු නොවන ගණුදෙනුවේ ප්‍රතිපලයක් ලෙස බැඳීමක් පැනනගින අවස්ථාවලදී එම කොන්දේසිය ඉටුවනතුරුමධ්‍යස්ථානය එය වගකීමක් ලෙස හඳුනාගනී.

රාජ්‍ය ප්‍රදාන තුලින් ජනිතවන වත්කම් හා ආදායම් එය හඳුනාගන්නා දිනයේ පවතින ධාරන අගයට දැක්වේ. මූල්‍ය වත්කම් ඒවායේ නාමික අගයට දැක්වේ.

(ආ) පුනරාවර්තන ප්‍රදාන

පුනරාවර්තන ස්වභාවයේ වියදම් සඳහා ලැබෙන රාජ්‍ය ප්‍රදාන මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ හුවමාරු නොවන ගණුදෙනු යටතේ හඳුනාගනු ලැබේ.

(ඇ) රාජ්‍ය ප්‍රදාන හා අනෙකුත් ප්‍රාග්ධන හුවමාරු ශ්‍රී.මු.වා.ප්‍ර.11 අනුව 2023 වර්ෂයේ සිට මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ හුවමාරු නොවන ගණුදෙනු ආදායම් යටතේ හඳුනාගනු ලැබේ. ප්‍රාග්ධන ගණුදෙනු වලින් ජනිත වන ප්‍රාග්ධන අතිරික්තය/ ඌනතාවය මූල්‍ය ප්‍රකාශන වල සමුච්චිත අරමුදල - ප්‍රාග්ධන යටතේ දැක්වේ.

සමුච්චිත අරමුදල - ප්‍රාග්ධන නැවත වර්ගීකරණය

විශ්වවිද්‍යාලය2022 වර්ෂයේ සිට ශ්‍රී.මු.වා.ප්‍ර.11 - හුවමාරු නොවන ගණුදෙනු ආදායම් ප්‍රමිතයට අනුගතව එය යොදාගනී.

මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ නිවැරදිභාවය ඉටුකිරීම සඳහා ශ්‍රී.මු.වා.ප්‍ර.11 ප්‍රකාරව සහ APFASL මාර්ගෝපදේශ අනුව වැයකරන ලද ප්‍රාග්ධන වියදම, වැය නොකරන ලද ප්‍රාග්ධන වියදම,ත්‍යාග සහ ප්‍රදාන, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශයේ සමුච්චිත අතිරික්තය - ප්‍රාග්ධන යටතේ නැවත වර්ගීකරණය කර දැක්වේ.

3.10 වියදම් හඳුනාගැනීම

මධ්‍යස්ථානයේ සියලු කාර්යයන් ඉටුකිරීමේදී දරන ලද වියදම් උපචිත පදනම යටතේ හඳුනාගන ලබන අතර
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයය සටහන් කරනු ලැබේ.

3.11 අසම්භව්‍ය වත්කම්

ප්‍රදානලාභීන් හා විශ්වවිද්‍යාලය අතර එලඹෙන ලද ගිවිසුම් ප්‍රකාරව ප්‍රදානලාභීන් විසින් ඉල්ලා අස්කරගන්නා ලද ප්‍රදාන වලින් අයකරගතයුතු ප්‍රමානය සඳහා වන නීතිමය කටයුතු අදාල විශ්වවිද්‍යාලය විසින් නීතිපති දෙපාර්තමේන්තුව හරහා සිදුකරනු ලැබේ. ප්‍රදාන ඉල්ලා අස්කරගන්නා ලද හා විශ්වවිද්‍යාල විසින් නීතිමය කටයුතු ආරම්භ කරනලද ප්‍රදානලාභීන්ගෙන් අයකරගතයුතු ප්‍රමානය පහත දැක්වේ.

| වර්ෂය | නම | අධ්‍යනාංශය/ විශ්වවිද්‍යාලය | මුදල<br>රු. |
|---|---|---|---|
| 2006 | එච්. සිරිවර්ධන මිය | මාධ්‍ය අධ්‍යයන අධ්‍යනාංශය, ශ්‍රීපාලි මණ්ඩපය | 500,000/- |
| 2006 | ජේ.ටී.ද සිල්වා මෙය | ලලිත කලා අධ්‍යනාංශය, පේරාදෙනිය විශ්වවිද්‍යාලය | 1,602,630/- |
| 2013 | එන් ඩබ්. එෆ්.ඩී.බී. එන් පෙරේරා මෙය | කොළඹ විශ්වවිද්‍යාලය | 3,000,000/- |

3.12 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

ශ්‍රී.ලං.ගි.ප්‍ර. 07 අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කිරීමේදී සෘජු නොවන ක්‍රමය භාවිතා කරන ලදී.

# මූල්‍ය ප්‍රකාශන වලට සටහන්
# 2023 දෙසැම්බර් 31 දිනට

සටහන - 1

| දේපල පිරියත හා උපකරණ | 2023 – 01 – 01 දිනට නැවත ප්‍රකාශිත ශේෂය | එකතු කිරීම් | ගැලපීම් | අපහරනය කිරීම් | 2023-12-31 දිනට ශේෂය |
|---|---|---|---|---|---|
| **පිරිවැය** | රු. | රු. | රු. | රු. | රු. |
| ඉඩම් හා සංවර්ධන | 40,793,418 | - | | - | 40,793,418 |
| NCAS ගොඩනැගිලි | 31,381,167 | - | | - | 31,381,167 |
| ලීබඩු හා සවිකිරීම් | 3,214,950 | 144,485 | | - | 3,359,435 |
| යන්ත්‍ර පිරියත හා කාර්යාල උපකරණ | 7,230,464 | 1,067,302 | | - | 8,297,766 |
| පරිගනක හා මුද්‍රකාංග | 16,650,979 | 2,486,258 | | - | 19,137,237 |
| පුස්තකාල පොත් සහ සගරා | 277,230 | - | | - | 277,230 |
| | **99,548,208** | **3,698,045** | | **-** | **103,246,253** |

| | 2023 – 01 – 01 දිනට ප්‍රකාශිත ශේෂය | වර්ෂය සඳහා ගාස්තු | ගැලපීම් | අපහරනය කිරීම් | 2023 – 12 -31 දිනට ශේෂය |
|---|---|---|---|---|---|
| **ක්ෂය** | රු. | රු. | රු. | රු. | රු. |
| ඉඩම් හා සංවර්ධන | - | - | - | - | - |
| NCAS ගොඩනැගිලි | 26,571,184 | 1,569,058 | - | - | 28,140,242 |
| ලීබඩු හා සවිකිරීම් | 3,076,077 | 49,249 | - | - | 3,125,326 |
| යන්ත්‍ර පිරියත හා කාර්යාල උපකරණ | 6,774,816 | 329,092 | (22,174) | - | 7,081,735 |
| පරිගනක හා මුද්‍රකාංග | 16,620,352 | 194,600 | (200,172) | - | 16,614,779 |
| පුස්තකාල පොත් සහ සගරා | 277,230 | - | - | - | 277,230 |
| | **53,319,659** | **2,141,999** | **(222,346)** | **-** | **55,239,314** |
| **ලියාහරින ලද අගය** | **46,228,549** | | | | **48,006,939** |

# මූල්‍ය ප්‍රකාශන වලට සටහන්
2023 දෙසැම්බර් 31 දිනට

| | සටහන් | 2023<br>රු. | 2022<br>නැවත ප්‍රකාශිත<br>රු. |
|---|---|---|---|
| **තොග** | 2 | | |
| ලිපිද්‍රව්‍ය | | 496,030 | 367,545 |
| මුද්‍රණ ලිපිද්‍රව්‍ය | | 148,543 | 152,987 |
| තොග - වෙනත් | | 23,930 | 19,495 |
| | | **668,504** | **540,027** |
| **තැන්පතු,අත්තිකාරම් සහ කලින් ගෙවීම්** | 3 | | |
| ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය | | 2,500 | 2,500 |
| ඇක්සස් නැචුරල් වෝටර් (පුද්ගලික) සමාගම | | 4,500 | 4,500 |
| ආපදා ණය | | 1,245,500 | 1,517,249 |
| පරිගණක ණය | | 39,500 | 48,500 |
| වාහන ණය | | 49,167 | 42,833 |
| කාර්යමණ්ඩල ණය - ශ්‍රීලංගිප්‍ර - 39 | | (2,795,155) | (2,407,966) |
| කාර්යමණ්ඩල ප්‍රතිලාභ - කලින් ගෙවීම් | | 2,795,155 | 2,407,966 |
| කලින් ගෙවීම් | | 267,149 | - |
| අත්තිකාරම් - උත්සව | | - | 8,750 |
| අත්තිකාරම් - විශේෂ | | - | 1,600 |
| අත්තිකාරම් - AHEAD | | 1,791,313 | - |
| | | **3,399,629** | **1,625,932** |
| **ස්ථාවර තැන්පතු** | 4 | | |
| # - 74710820 | | 845,000 | 845,000 |
| # - 80573912 | | 2,880,000 | 2,880,000 |
| # - 80573876 | | 1,440,000 | 1,440,000 |
| # - 1676001000102921 | | 1,901,526 | 1,655,014 |
| # - 90184050 | | 24,221,421 | - |
| # - 91342901 | | 24,332,182 | - |
| | | **55,620,129** | **6,820,014** |
| **මුදල් හා මුදල් සමාන දෑ** | 5 | | |
| NCAS ගිණුම් අංක - 3532126 ලංකා බැංකුව | | 36,896,129 | 13,262,229 |
| REPO | | - | 58,000,000 |
| | | **36,896,129** | **71,262,229** |

# මූල්‍ය ප්‍රකාශන වලට සටහන්
## 2023 දෙසැම්බර් 31 දිනට

| | සටහන් | 2023<br>රු. | 2022<br>නැවත ප්‍රකාශිත<br>රු. |
|---|---|---|---|
| අර්ථ දක්වනලද ප්‍රතිලාභ සැලැස්ම | 6 | | |
| විශ්‍රාමික වගකීම් | | | |
| 2023 ජනවාරි 1 දිනට ශේෂය | | 1,576,372 | 2,175,724 |
| | | 116,668 | (599,352) |
| | | 1,693,040 | 1,576,372 |
| 2023 දෙසැම්බර් 31 දිනට ශේෂය | | **1,693,040** | **1,576,372** |
| උපචිත වියදම් | 7 | | |
| පුනරු- ගොඩනැගිලි සහ සැලසුම් | | - | - |
| ආරක්ෂක ගාස්තු | | 87,343 | 87,318 |
| ප්‍රවාහන | | 6,220 | 44,475 |
| තැපැල් ගාස්තු | | 1,175 | 1,810 |
| විදුලිය | | 66,091 | 31,952 |
| ජල ගාස්තු | | 7,073 | 7,261 |
| දුරකථන ගාස්තු | | 61,622 | 7,257 |
| සනීපාරක්ෂක සේවා | | 68,650 | 174,750 |
| විගණන ගාස්තු - 2021 | | - | 620,130 |
| විගණන ගාස්තු - 2022 | | - | 660,330 |
| විගණන ගාස්තු - 2023 | | 677,556 | - |
| පුවත්පත් ගාස්තු | | 13,600 | 32,660 |
| | | **989,329** | **1,667,943** |
| ගෙවිය යුතුදෑ | 8 | | |
| මුද්දර ගාස්තු | | 4,600 | 2,825 |
| කොන්ත්‍රාත් | | - | 47,015 |
| ආචාර්ය/දර්ශනපති ප්‍රදාන | | 32,367,652 | 46,335,934 |
| පැමිනීමේ දීමනා ( පර්යේෂන සාමාජික රැස්වීම්) | | 18,000 | - |
| පැමිනීමේ දීමනා (කළමනාකරණ සභාව) | | 42,000 | - |
| ජාත්‍යන්තර පර්යේෂන සමුලුව | | 178,672 | - |
| අධ්‍යක්ෂක දීමනා | | 593,048 | - |
| වැඩබලන මූල්‍යාධිකාරී දීමනා | | 16,545 | - |
| පුහුණු දීමනා | | 20,500 | - |
| අතිකාල | | 35,864 | - |
| ලංසු සුරක්ෂන | | 54,000 | 44,000 |
| ගෙවියයුතු රඳවාගැනීම් බදු | | - | 48,840 |
| ගෙවියයුතු APIT | | 39,474 | 64,777 |
| විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිශන් සභාවට ගෙවියයුතු | | - | - |
| සේවක අර්ථසාධක අරමුදලට ගෙවියයුතු | | 47,609 | 47,609 |
| සේවක භාරකාර අරමුදලට ගෙවියයුතු | | 6,391 | 6,391 |
| ශ්‍රී.ලං.නි.සේ.ස. | | 140 | - |
| වෙනත් | | 13,246 | 536,669 |
| | | **33,437,742** | **47,134,059** |

# මූල්‍ය ප්‍රකාශන වලට සටහන්

**2023 දෙසැම්බර් 31 දිනට**

| | සටහන් | 2023<br>රු. | 2022<br>නැවත ප්‍රකාශිත<br>රු. |
|---|---|---|---|
| **<u>පුනරාවර්තන ප්‍රදාන</u>** | 9 | | |
| සේවක පාරිශ්‍රමික | | 17,000,000 | 17,373,000 |
| වෙනත් පුනරාවර්තන | | 9,960,000 | 8,290,000 |
| | | **26,960,000** | **25,663,000** |
| **<u>වෙනත් ආදායම්</u>** | 10 | | |
| වෙනත් ආදායම් | | 185,857 | 54,088 |
| පොලී ආදායම් - IFRS | | 129,780 | 157,745 |
| සුහසාධන ආදායම් | | 31,100 | 11,900 |
| පොලී ආදායම් - ස්.තැ | | 5,088,261 | 579,278 |
| පොලී ආදායම් - REPO | | 3,989,585 | 2,562,121 |
| පර්යේෂන සමුලු ආදායම් | | 236,000 | - |
| අයදුම්පත් ගාස්තු | | 86,000 | 10,000 |
| පාඨමාලා ගාස්තු - NVIVO | | 196,000 | - |
| වැඩමුලු ආදායම් | | - | 226,521 |
| | | **9,942,583** | **3,601,653** |
| **<u>රජයේ ප්‍රදාන - ප්‍රාග්ධන</u>** | 11 | | |
| ප්‍රාග්ධන ප්‍රදාන - අත්පත්කර ගැනීම් | | - | 700,000 |
| මානව සම්පත් සංවර්ධන | | 20,000,000 | 43,700,000 |
| | | **20,000,000** | **44,400,000** |
| **<u>සේවක පාරිශ්‍රමික</u>** | 12 | | |
| වැටුප් හා වේතන දායකය | | 5,523,454 | 5,008,457 |
| අර්ථසාධක අරමුදල් දායකය | | 1,253,246 | 665,140 |
| විශ්‍රාම වැටුප් අරමුදල් දායකය | | 424,955 | 572,677 |
| සේවක භාරකාර අරමුදල් දායකය | | 335,640 | 247,564 |
| ජීවන වියදම් දීමනා | | 872,619 | 989,845 |
| අධ්‍යන දීමනා | | 3,066,650 | |
| වෙනත් දීමනා | | 3,570 | 58,000 |
| අතිකාල | | 297,451 | 33,626 |
| පර්යේෂන දීමනා | | 671,978 | 221,083 |
| අතිරේක දීමනා | | 1,104,691 | 1,001,691 |
| වන්දි දීමනා | | 1,621,583 | 2,253,806 |
| කාර්යමණ්ඩල පිරිවැය - ජා.මු.වා.ප්‍ර ගැලපීම් | | 129,780 | 157,745 |
| මාසික දීමනා (රු.5000) | | 559,371 | 634,516 |
| වැඩබැලීමේ දීමනා | | 208,865 | 2,813,117 |
| විදුලි සංදේශ දීමනා | | 74,250 | - |
| සංග්‍රහ දීමනා | | 182,776 | - |
| ප්‍රවාහන දීමනා | | 220,000 | - |
| ඉන්ධන දීමනා | | 564,775 | - |
| | | **17,115,653** | **14,657,267** |

# මූල්‍ය ප්‍රකාශන වලට සටහන්
2023 දෙසැම්බර් 31 දිනට

| | සටහන් | 2023<br>රු. | 2022<br>නැවත ප්‍රකාශිත<br>රු. |
|---|---|---|---|
| **සැපයීම්** | 13 | | |
| ලිපිද්‍රව්‍ය හා කාර්යාල අවශ්‍යතා | | 442,533 | 164,574 |
| ඉන්ධන හා ලිහිසි | | 7,180 | - |
| වෙනත් සැපයීම් | | 21,570 | 2,635 |
| | | **471,283** | **167,209** |
| **නඩත්තු** | 14 | | |
| වාහන | | 111,245 | |
| පිරියත යන්ත්‍ර හා කාර්යාල උපකරණ | | 1,281,125 | 1,912,291 |
| වෙනත් | | 16,313 | 21,060 |
| | | **1,408,683** | **1,933,351** |
| **නඩත්තු** | 15 | | |
| වාහන | | 76,840 | 67,946 |
| විදුලි සංදේශ | | 608,846 | 501,902 |
| තැපැල් ගාස්තු | | 65,500 | 36,925 |
| විදුලිය | | 1,105,576 | 509,006 |
| ආරක්ෂක සේවා | | 1,028,387 | 927,863 |
| ජලය | | 103,610 | 60,097 |
| සනීපාරක්ෂක සේවා | | 602,350 | 409,500 |
| වරිපනම් හා බදු - ප්‍රාදේශීය අධිකාරීන් | | 259,707 | 197,120 |
| මුද්‍රණ හා ප්‍රචාරන | | 19,000 | 452,983 |
| වෙනත් | | 73,120 | 34,770 |
| | | **3,942,936** | **3,198,112** |
| **වෙනත් පුනරාවර්තන** | 16 | | |
| කාර්යමණ්ඩල සංවර්ධන | | - | - |
| විශේෂ සේවා - සභා සහ කමිටු | | 1,201,895 | 507,589 |
| නිවාඩු වරෙන්තුව | | 23,200 | - |
| බැංකු ගාස්තු | | 2,040 | 165 |
| සේවක සුභසාධනය | | 74,523 | 41,539 |
| වෙනත් | | 1,434,276 | 1,541,521 |
| දේපල ණය පොළී | | 52,413 | 15,473 |
| පාඨමාලා වියදම් - Nvivo | | 129,708 | - |
| | | **2,918,054** | **2,106,286** |
| **මානව ප්‍රාග්ධන සංවර්ධන අරමුදල** | 17 | | |
| ආචාර්ය/දර්ශනපති ප්‍රදාන | | 37,720,320 | 28,399,976 |
| බුද්ධි ප්‍රවර්ධන ප්‍රදාන | | 907,302 | 986,790 |
| පර්යේෂණ සමුලු | | 2,625,890 | 203,270 |
| | | **41,253,512** | **29,590,035** |

## මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යාව පිළිබඳ උසස් අධ්‍යයන සඳහා වූ ජාතික මධ්‍යස්ථානය (එන්.සි.ඒ.එස්.)

## සත්‍ය වියදම් සහ අයවැයගත වියදම් සැසඳීමේ ප්‍රකාශය
## 2023 වර්ෂය සඳහා

| | අයවැයගත ප්‍රතිපාදන | සත්‍ය ලැබීම් | සත්‍ය වියදම් | විචලනය | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | අයවැයගත ප්‍රතිපාදන අනුව | | සත්‍ය ලැබීම් අනුව | |
| | රු. | රු. | රු. | රු. | % | රු. | % |
| සේවක පාරිශ්‍රමික | 17,000,000 | 17,000,000 | 16,985,873 | 14,127 | 100 | 14,127 | 100 |
| අනෙකුත් පුනරාවර්තන වියදම් | 9,960,000 | 9,960,000 | 8,611,248 | 1,348,752 | 86 | 1,348,752 | 86 |
| <u>මානව ප්‍රාග්ධන සංවර්ධන ව්‍යාපෘතිය</u> | | | | | | | |
| ආචාර්ය/ දර්ශනපති පර්යේෂණ ප්‍රදාන | 72,000,000 | 20,000,000 | 20,000,000 | 52,000,000 | 28 | - | 100 |
| | **98,960,000** | **46,960,000** | **45,597,121** | **53,362,879** | | **1,362,879** | |

# ජාතික විගණන කාර්යාලය
## தேசிய கணக்காய்வு அலுவலகம்
## NATIONAL AUDIT OFFICE


මගේ අංකය / எனது இல. / My No. } HED/A/NCAS/FA/2023    ඔබේ අංකය / உமது இல. / Your No. }    දිනය / திகதி / Date } 2024 ජූනි 20 දින

අධ්‍යක්ෂ

මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා උසස් අධ්‍යයනය සඳහා වූ ජාතික මධ්‍යස්ථානය

**මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා උසස් අධ්‍යයනය සඳහා වූ ජාතික මධ්‍යස්ථානයේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

සහතික කරන ලද ගිණුම සහ යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

ඩබ්ලිව්.එම්.පී.ඒ.ෆොන්සේකා
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

National Centre for Adv... NCA 17 JUL 2024

පිටපත් :-

1. ලේකම් - අධ්‍යාපන අමාත්‍යාංශය
2. ලේකම් - මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය


අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

මගේ අංකය / எனது இல. / My No. } HED/A/NCAS/FA/2023    ඔබේ අංකය / உமது இல. / Your No. }    දිනය / திகதி / Date } 2024 ජුනි 20 දින

අධ්‍යක්ෂ

මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා උසස් අධ්‍යයනය සඳහා වූ ජාතික මධ්‍යස්ථානය

**මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා උසස් අධ්‍යයනය සඳහා වූ ජාතික මධ්‍යස්ථානයේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා උසස් අධ්‍යයනය සඳහා වූ ජාතික මධ්‍යස්ථානයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, අරමුදල් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාල තොරතුරුද ඇතුලත් මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107,111 වගන්ති සහ 2005 අංක 02 දරන මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා නියමාවලියේ 26 වන වගන්තිය හා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මධ්‍යස්ථානයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.




අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව   இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை   No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka

+94 11 2 88 70 28 - 34   +94 11 2 88 72 23   ag@auditorgeneral.gov.lk   www.naosl.gov.lk

## 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මධ්‍යස්ථානයේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු.

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන මධ්‍යස්ථානයේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මාගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මාගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ විගණනයට අදාළව, මාගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මාගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මධ්‍යස්ථානයේ 2023 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

## 1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මධ්‍යස්ථානය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය මධ්‍යස්ථානය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මධ්‍යස්ථානයේ අඛණ්ඩ පැවැත්මට අදාල කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මධ්‍යස්ථානයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, මධ්‍යස්ථානයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්,

. චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන්· මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මධ්‍යස්ථානය අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා මධ්‍යස්ථානයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

**2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

**2.1** 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(අ) වගන්තිය සඳහන් අවශ්‍යතාවයන් අනුව විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලද අතර මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා මධ්‍යස්ථානය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(IV) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වසරේදී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත්ව ඇත.

**2.2** අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවිය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මධ්‍යස්ථානයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට මධ්‍යස්ථානයට සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඊ) වගන්තියේ සඳහන් නිරීක්ෂණයන් හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ මධ්‍යස්ථානයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මධ්‍යස්ථානයේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මධ්‍යස්ථානයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායි ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

**2.3** වෙනත් කරුණු

2005 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා කාලසීමාව තුළ පශ්චාත් උපාධි ප්‍රදාන ලබාදුන් ප්‍රදානලාභීන් 32 දෙනෙකු බැඳුම්කර ගිවිසුම් කඩකිරීම හේතුවෙන් 2023 දෙසැම්බර් 31 දිනට රු.96,264,122ක් අයවිය යුතුව පැවතුණි.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න

විගණකාධිපති

| මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යාව පිළිබඳ උසස් අධ්‍යයන සඳහා වූ ජාතික මධ්‍යස්ථානයේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විගණකාධිපති වාර්තාවෙහි දැක්වෙන නිර්දේශයන්ට අනුකූලව ආයතනය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග | | | |
|---|---|---|---|
| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | නිර්දේශ අනුව ගත් ක්‍රියාමාර්ග |
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 119 | 2005 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා කාලසීමාව තුළ පශ්චාත් උපාධි ප්‍රදාන ලබාගත් ප්‍රදානලාභීන් 32 දෙනෙකුගෙන් බැඳුම්කර ගිවිසුම් කඩකිරීම හේතුවෙන් 2023 දෙසැම්බර් 31 දිනට රු.96,264,122ක් අයවිය යුතුව පැවතුණි. | බැඳුම්කර ගිවිසුම් කඩකිරීම හේතුවෙන් අයවිය යුතු මුදල් අයකර ගැනීමට කඩිනම් පියවර ගතයුතුය. | 2005 සිට 2020 වර්ෂය දක්වා කාලයේදී බැඳුම් කර ගිවිසුම් කඩ කිරීම හේතුවෙන් ප්‍රදාන මුදල් අයකර ගැනීමට ප්‍රදාන ලාභීන් 28 දෙනෙකු මේ වනවිට හඳුනාගෙන ඇති අතර ඉන් ප්‍රදාන ලාභීන් 04 දෙනෙකුගෙන් මේ වන විටත් ප්‍රදාන මුදල් අයකර ගනිමින් ඇත. තවත් ප්‍රදාන ලාභීන් 02 නෙක් අදාල විශ්වවිද්‍යාල වලට සිය ප්‍රදාන මුදල් ගෙවමින් ඇති බවත් තවත් 03 දෙනෙකු වෙනුවෙන් අදාල විශ්වවිද්‍යාල නීතිමය කටයුතු සිදුකරමින් පවතින බවත් දන්වා ඇත. ඉතිරි ප්‍රදාන ලාභීන් 19 දෙනාගෙන් ප්‍රදාන මුදල් අයකර ගැනීම සඳහා අදාල විශ්වවිද්‍යාල වලට දැනුවත් කිරීමේ ලිපි සහ සිහිකැඳවීමේ ලිපි යවා අත. ඒ අනුව අදාල විශ්වවිද්‍යාල ඉදිරි ක්‍රියා මාර්ග සිදු කරමින් ඇත. |

වාර්ෂික වාර්තාවට අදාළ කාල සීමාව සඳහා විගණන විමසුම්වල පෙන්වා දී ඇති කරුණු නිවැරදි කිරීම සඳහා අදාළ ආයතනයේ සහ එහි අධ්‍යක්ෂ මණ්ඩලය / පාලක මණ්ඩලයේ කළමනාකාරිත්වය විසින් ගනු ලැබූ සහ ගැනීමට අපේක්ෂිත ක්‍රියාමාර්ග